# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1979 අංක 44 දරන ප්‍රාථමික අධිකරණ නඩු විධාන පනත

[සහතිකය සටහන් කළේ 1979 ජූනි මස 28 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1979 ජූනි මස 29 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක

මිල : රු. 2.00 යි　　තැපැල් ගාස්තුව : රු. 1.00 යි

1979 අංක 44 දරන ප්‍රාථමික අධිකරණ නඩු විධාන පනත

[සහතිකය සටහන් කළේ 1979 ජූනි මස 28 වන දින]

එල්.ඩී.—ඕ. 74/78

ප්‍රාථමික අධිකරණයන්හි කාර්ය පටිපාටිය විධිමත් කිරීම සඳහා සහ ඒ හා සම්බන්ධ කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1979 අංක 44 දරන ප්‍රාථමික අධිකරණ නඩු විධාන පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන යම් දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය. ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය.

## I වන කොටස

## සාමාන්‍ය විධිවිධාන

2. ප්‍රාථමික අධිකරණයන්හි සිවිල් සහ අපරාධ අධිකරණ බලය මේ පනතෙහි හා වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව තනි අධිකරණ බලය විය යුතු ය. ප්‍රාථමික අධිකරණයන්හි සිවිල් සහ අපරාධ අධිකරණ බලය තනි අධිකරණ බලය වන බව.

3. දිසා අධිකරණයක් හෝ මහෙස්ත්‍රාත් අධිකරණයක් ඉදිරියෙහි පවරනු ලැබූ සිවිල් වුව ද අපරාධ වුව ද යම් නඩුවක දී, එය ප්‍රාථමික අධිකරණයක තනි අධිකරණ බලය ඇතුළත වූ නඩුවක් බව නඩු කටයුතුවල යම් අවධියක දී ඒ දිසා හෝ මහෙස්ත්‍රාත් අධිකරණයට පෙනී ගියහොත් අධිකරණය විසින් ඒ නඩුව පිළිබඳ වැඩිදුර කටයුතු නවත්වා එහි පාර්ශ්වකරුවන් ඒ ප්‍රාථමික අධිකරණය වෙත යොමු කළ හැකි ය. තව ද ඒ නඩුව, සිවිල් නඩුවක් වන අවස්ථාවක ගාස්තු සම්බන්ධයෙන් සාධාරණ යයි පෙනී යන ආඥාවක් ද අධිකරණය විසින් කළ හැකි ය. ප්‍රාථමික අධිකරණයන්හි තනි අධිකරණ බලය ඇතුළත වූ නඩු සම්බන්ධයෙන් අධිකරණවලට අයත් කාර්යය.

4. (1) ප්‍රාථමික අධිකරණයක තනි අධිකරණ බලය ඇතුළත සිදු කරන ලද වරදක් සම්බන්ධයෙන් යම් අපරාධ නඩුවක් හෝ නඩු කටයුත්තක් ඒ අධිකරණයෙහි විනිශ්චයට භාජනව පවත්නා අවස්ථාවක, සම්බන්ධතාවක් ඇති යම් පාර්ශ්වකරුවකු විසින් කරනු ලබන ඉල්ලීමක් මත අභියාචනාධිකරණය විසින්, නැතහොත් නීතිපතිවරයා විසින් ද අවස්ථාගත කරුණු අනුව උචිත යයි පෙනී යන කල්හි, ඒ අපරාධ නඩුව හෝ නඩු කටයුත්ත ස්වකීය විධාන යෙහි සඳහන් මහෙස්ත්‍රාත් අධිකරණයට මාරු කරන ලෙස විධාන කිරීම නීත්‍යනුකූල විය යුතු ය. අපරාධ නඩුවක් මහෙස්ත්‍රාත් අධිකරණයට මාරු කරන ලෙස විධාන කිරීමට අභියාචනාධිකරණයට හෝ නීතිපති වරයාට ඇති අයිතිය.

(2) ඒ නඩුව විනිශ්චයට භාජනව පවත්නේ යම් විනිශ්චයකාර වරයකුගේ ප්‍රාථමික අධිකරණයක ද ඒ විනිශ්චයකාරවරයා වෙත (1) වන උපවගන්තිය යටතේ කරන ලද විධානයක් දැනුම් දෙනු

2—ඒ 42096—14,500 (79/06)

ලැබූ අවස්ථාවක, ඔහු විසින්, ඒ නඩුව පිළිබඳ වැඩිදුර කටයුතු නවත්වා නඩු වාර්තාව හා සියලු සම්බන්ධ ලියකියවිලි ඒ විධානයෙහි සඳහන් මහේස්ත්‍රාත් අධිකරණය වෙත යැවිය යුතු ය.

(3) (2). වන උපවගන්තියෙහි සඳහන් මහේස්ත්‍රාත් අධිකරණය, ඒ නඩුව ඒ මහේස්ත්‍රාත් අධිකරණයෙහි පවරනු ලැබූ අපරාධ නඩුවක් හෝ නඩු කටයුත්තක් වූවාක් මෙන් එය විභාග කිරීම, නඩු විභාග කිරීම හා තීරණය කිරීම කරගෙන යා යුතු අතර එසේ කිරීම සඳහා එයට පූර්ණ බලය හා අධිකරණ බලය තිබිය යුතු ය. තව ද එසේ කිරීම සඳහා පූර්ණ බලය හා අධිකරණ බලය එය සතු විය යුතු ය.

දිසා අධිකරණයට නඩුව මාරු කිරීමට අභියාචනාධි කරණයට ඇති බලය.

5. ප්‍රාථමික අධිකරණයක පවරන ලද යම් සිවිල් නඩුවක් හෝ නඩු කටයුත්තක් ඊට සම්බන්ධව ඇති අවස්ථාගත කරුණු හෝ ප්‍රශ්න නිසා ප්‍රාදේශීය අධිකරණ බලය ඇති දිසා අධිකරණය ඉදිරියෙහි වඩා උචිත ලෙස නඩු විභාග කළ හැකි බව පාර්ශ්වකරුවන් අතුරින් එක් පාර්ශ්වකරුවකු විසින් කරනු ලැබූ ඉල්ලීමක් මත හෝ අන්‍යාකාරයකින් අභියාචනාධිකරණයට පෙන්නුම් කරනු ලැබූ අවස්ථාවක, අභියාචනාධිකරණය විසින් ඒ නඩුවේ හෝ නඩු කටයුත්තේ නඩු වාර්තාව හෝ කාර්ය සටහන් පත්‍රිකාව ගෙන්වා ගෙන පරීක්ෂා කිරීම ද ඒ පිළිබඳ ප්‍රාථමික අධිකරණයේ නඩු කටයුතු නැවැත්වීම ද විභාග කොට තීරණය කිරීම සඳහා ඒ නඩුව ඒ දිසා අධිකරණයට මාරු කරමින් ආඥාවක් කිරීම ද නීත්‍යානුකූල විය යුතු ය. ඒ නඩුව හෝ නඩු කටයුත්ත විනිශ්චයට භාජනව පවතින්නේ යම් විනිශ්චයකාරවරයකුගේ ප්‍රාථමික අධිකරණයක ද ඒ විනිශ්චයකාරවරයා වෙත ඒ ආඥාව දැනුම් දෙනු ලැබූ විට, ඔහු විසින්, ඒ නඩුවේ හෝ නඩු කටයුත්තේ වැඩිදුර කටයුතු නවත්වා ඒ නඩුවේ හෝ නඩු කටයුත්තේ නඩු වාර්තාව හා සියලු සම්බන්ධ ලියකියවිලි ආඥාවෙහි සඳහන් දිසා අධිකරණය වෙත යැවිය යුතු ය. එසේ කරනු ලැබූ විට ඒ දිසා අධිකරණය විසින්, ඒ නඩුව හෝ නඩු කටයුත්ත ඒ දිසා අධිකරණයෙහි පවරනු ලැබූ නඩුවක් හෝ නඩු කටයුත්තක් වූවාක් මෙන් ඒ නඩුව හෝ නඩු කටයුත්ත විභාග කිරීම, නඩු විභාග කිරීම හා තීරණය කිරීම කරගෙන යා යුතු අතර එසේ කිරීම සඳහා එයට පූර්ණ බලය හා අධිකරණ බලය තිබිය යුතු ය. තව ද එසේ කිරීම සඳහා පූර්ණ බලය හා අධිකරණ බලය එය සතු විය යුතු ය.

වෙනත් අධිකරණයක නඩු විභාග කිරීම වඩා උචිත නඩුවක් ප්‍රාථමික අධිකරණයේ විනිශ්චයකාර වරයා විසින් ආඥාවක් සඳහා අභියාචනාධි කරණයට වාර්තා කළ යුතු බව.

6. යම් ප්‍රාථමික අධිකරණයකට—

(අ) ඒ ප්‍රාථමික අධිකරණය ඉදිරියෙහි විනිශ්චයට භාජනව පවත්නා යම් වරදක් පිළිබඳ යම් අපරාධ නඩුවක් සම්බන්ධයෙන්, නියම කරනු ලැබීමට ඒ ප්‍රාථමික අධිකරණයට නීතියෙන් බලය දී ඇති යම් දණ්ඩනයකින් ඒ නඩුවේ අවස්ථාගත කරුණු අනුව ඒ වරද සඳහා ප්‍රමාණවත් ලෙස දඬුවම් කළ නොහැකි බව ; හෝ

(ආ) ඒ ප්‍රාථමික අධිකරණය ඉදිරියෙහි විනිශ්චයට භාජනව පවත්නා යම් සිවිල් නඩුවක් හෝ නඩු කටයුත්තක් සම්බන්ධයෙන්, ඒ නඩුව හෝ නඩු කටයුත්ත දිසා අධිකරණයක් ඉදිරියෙහි වඩා උචිත ලෙස නඩු විභාග කළ හැකි බව

පෙන්නුම් කරනු ලැබූ අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි ඒ අපරාධ නඩුව හෝ සිවිල් නඩුව හෝ නඩු කටයුත්ත වැඩිදුරටත් විභාග කිරීම අත්හිටුවීම ද 4 වන වගන්තිය හෝ 5 වන වගන්තිය යටතේ ආඥාවක් ලබා ගැනීම පිණිස එය අභියාචනාධිකරණයට වාර්තා කිරීම ද ඒ ප්‍රාථමික අධිකරණයේ විනිශ්චයකාරවරයාගේ කාර්යය විය යුතු ය.

7. (1) ප්‍රාථමික අධිකරණයක් ඉදිරියෙහි ඇති යම් අපරාධ නඩුවක්, සිවිල් නඩුවක් හෝ නඩු කටයුත්තක් පවත්වා ගෙන යනු ලබන අතරතුර ඒ අපරාධ නඩුව, සිවිල් නඩුව හෝ නඩු කටයුත්ත ස්වකීය අධිකරණ බල සීමාව ඇතුළත නොවන බව ඒ අධිකරණයට පෙනියන අවස්ථාවක නඩු කටයුතු නැවැත්වීමට ද ඒ අපරාධ නඩුව, සිවිල් නඩුව හෝ නඩු කටයුත්ත පවරන ලද්දේ යම් පාර්ශ්වකරුවකු විසින් ද ඒ පාර්ශ්වකරු නිසි අධිකරණය වෙත යොමු කිරීම ද ඒ ප්‍රාථමික අධිකරණය සතු කාර්යය විය යුතු ය.

නඩුව අධිකරණ බලසීමාවෙන් පිටත වූ අවස්ථාවක පාර්ශ්වකරු නිසි අධිකරණය වෙත යොමු කිරීමේ කාර්යය.

(2) යම් ප්‍රාථමික අධිකරණයක් විසින් යම් අපරාධ නඩුවක, සිවිල් නඩුවක හෝ නඩු කටයුත්තක කටයුතු නතර කර ඒ අපරාධ නඩුව, සිවිල් නඩුව හෝ නඩු කටයුත්ත පවරන ලද්දේ යම් පාර්ශ්වකරුවකු විසින් ද ඒ පාර්ශ්වකරු (1) වන උපවගන්තිය යටතේ නිසි අධිකරණය වෙත යොමු කරනු ලබන අවස්ථාවක, එම වරද ම නැතහොත් කාරණාව ම සම්බන්ධයෙන් නිසි අධිකරණයෙහි යම් අපරාධ නඩුවක්, සිවිල් නඩුවක් හෝ නඩු කටයුත්තක් පැවරීමෙහි ලා බාධකයක් ලෙස ඒ අපරාධ නඩුව, සිවිල් නඩුව හෝ නඩු කටයුත්ත ක්‍රියාත්මක නොවිය යුතු ය.

## II වන කොටස

## දඬුවම් කිරීමේ බලතල

8. (1) පහත දැක්වෙන දණ්ඩන නියම අතුරින් කවර හෝ දණ්ඩන නියමයක් ප්‍රාථමික අධිකරණයක් විසින් කළ හැකි ය :—

ප්‍රාථමික අධිකරණයක් විසින් කළ හැකි දණ්ඩන නියම.

(අ) මාස තුනක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම ;

(ආ) රුපියල් දෙසිය පණහක් නොඉක්මවන දඩයක් ;

(ඇ) වරදකරු වයස අවුරුදු දහසයට අඩු නම් සැහැල්ලු වේවැලකින් තැළීම ;

(ඈ) ඉහත කී දණ්ඩන නියම අතුරින් කවර හෝ දණ්ඩන නියම දෙකක් ඒකාබද්ධ වූ යම් නීත්‍යානුකූල දණ්ඩන නියමයක්.

(2) චූදිතයකුට නියම කරන ලද යම් දඩයක් ගෙවීම පැහැර හරිනු ලැබූ විටක, ප්‍රාථමික අධිකරණයේ විනිශ්චයකාරවරයා විසින් මේ කොටසෙහි විධිවිධානවලට යටත්ව—

(අ) දඩයේ ප්‍රමාණය රුපියල් විසිපහක් නොඉක්මවන අවස්ථාවක, දින හතක් නොඉක්මවන කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමක් චූදිතයාට නියම කළ හැකි ය ;

(ආ) දඩයේ ප්‍රමාණය රුපියල් විසිපහක් ඉක්මවන නමුත් රුපියල් පණහක් නොඉක්මවන අවස්ථාවක, දින දහ හතරක් නොඉක්මවන කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමක් චූදිතයාට නියම කළ හැකි ය;

(ඇ) දඩයේ ප්‍රමාණය රුපියල් පණහක් ඉක්මවන අවස්ථාවක, මාස එකක් නොඉක්මවන කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමක් චූදිතයාට නියම කළ හැකි ය.

(3) මේ පනතින් හෝ වෙනත් යම් නීතියකින් ප්‍රාථමික අධිකරණයකට දෙනු ලැබිය හැකි දඬුවම් කිරීමේ විශේෂ බලතල කිසිවක් මේ වගන්තියෙහි වූ කිසිවකින් හීන වෙතැයි අර්ථ නිරූපණය කරනු නොලැබිය යුතු ය.

දින හතකට අඩු කාලයක් බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමය.

9. මේ පනතෙහි, දණ්ඩ නීති සංග්‍රහයෙහි හෝ වෙනත් යම් ලිඛිත නීතියක හෝ පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, දඩයක් ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් වුවද එසේ නොවූව ද, ප්‍රාථමික අධිකරණයක් විසින් යම් තැනැත්තකුට දින හතකට අඩු කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයක් නො කළ යුතු ය.

බන්ධනාගාරගත කිරීම වෙනුවට අධිකරණයේ සීමා තුළ රඳවා තැබීමේ දණ්ඩන නියමය.

10. දඩයක් ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් වුව ද එසේ නොවූව ද යම් අවස්ථාගත කරුණු යටතේ වරදකරුවකුට බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයක් කිරීමට යම් ලිඛිත නීතියකින් හෝ වෙනත් නීතියකින් ප්‍රාථමික අධිකරණයකට බලය පවරනු ලැබ ඇත්තේ ද ඒ අවස්ථාගත කරුණු යටතේ බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයක් කිරීම වෙනුවට, ආඥාව කරනු ලබන දිනයේ, එම ආඥාවෙහි අධිකරණය විසින් සඳහන් කරනු ලබන පස්වරු 4.00 ට පසුව නොවන යම් වේලාවක් වන තුරු, වරදකරු අධිකරණයේ සීමා තුළ රඳවා තබා ගත යුතු යයි ප්‍රාථමික අධිකරණයක් විසින් ආඥා කළ හැකි ය.

දඩයක් ගෙවීම පැහැර හැරීමේ දී බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමය කිරීමට ප්‍රාථමික අධිකරණයට ඇති බලය.

11. (1) දඩයක් ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් නියම කිරීමට නීතියෙන් බලය දී ඇති කාලයක බන්ධනාගාරගත කිරීමේ දඬුවමක්, එවැනි පැහැර හැරීමක දී ප්‍රාථමික අධිකරණයක් විසින් දිය හැකි ය. එසේ වුව ද නියම කරනු ලබන බන්ධනාගාරගත කිරීමේ කාලය මේ පනත යටතේ නියම කිරීමට අධිකරණයට බලය ඇති කාලය නොඉක්මවිය යුතු ය.

(2) මේ වගන්තිය යටතේ නියම කරනු ලබන බන්ධනාගාරගත කිරීම, අධිකරණය විසින් 8 වන වගන්තිය යටතේ නියම කරනු ලැබිය හැකි උපරිම කාලය සඳහා වූ බන්ධනාගාරගත කිරීමේ ප්‍රධාන දණ්ඩන නියමයකට අතිරේකව විය හැකි ය.

ප්‍රජා සේවා ආඥාව.

12. (1) චූදිත තැනැත්තකු වරදකරු කරනු ලැබූ විට බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයක් කරනු වෙනුවට හෝ දඩයක් ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් චූදිත තැනැත්තකුට බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයක් කරනු වෙනුවට, රජයේ හෝ

රජයේ මූලිකත්වය ඇති යෝජනා ක්‍රමයක නැතහොත් අන් තැනක, නම් කරන ලද ස්ථානයක දී නියම කරන ලද සේවාවන් ඉටු කරන ලෙස විධාන කරමින්, මෙහි මින් මතු “ප්‍රජා සේවා ආඥාව” යනුවෙන් සඳහන් කරනු ලබන ආඥාවක් ප්‍රාථමික අධිකරණයක් විසින් සටහන් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සටහන් කරනු ලැබූ ප්‍රජා සේවා ආඥාවක් ඒ අධිකරණයේ විනිශ්චයකාරවරයා විසින් විධාන කරනු ලබන ආකාරයකට ක්‍රියාවේ යොදවනු ලැබිය යුතු ය.

(3) ප්‍රජා සේවා ආඥාවක කාලසීමාව මාස තුනකට වැඩි නොවිය යුතු ය.

(4) ප්‍රජා සේවා ආඥාවක් සටහන් කරනු ලැබුවේ වරදකරු කරනු ලැබූ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තා, නම් කරන ලද ස්ථානයකට පැමිණ සිටීම නැතහොත් පැමිණ සිට නියම කරන ලද සේවාව ඉටු කිරීම පැහැර හරියි නම් හෝ ඔහුගේ පැමිණීම අක්‍රමවත් නම් හෝ නම් කරන ලද ස්ථානය භාරව සිටින නැත හොත් පාලනය කරන තැනැත්තා සෑහීමට පත් වන පරිදි වැඩ නොකරයි නම් හෝ ආඥාවට අනුව ක්‍රියා කිරීම අන්‍යාකාරයකින් පැහැර හරියි නම් හෝ එවිට, ප්‍රාථමික අධිකරණය විසින් ඒ ආඥාව ප්‍රත්‍යාදිෂ්ට කොට සුදුසු යයි අධිකරණය සලකන බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයක් කිරීම නීත්‍යානුකූල විය යුතු ය.

(5) නම් කරන ලද ස්ථානය භාරව සිටින හෝ පාලනය කරන තැනැත්තා විසින් ප්‍රජා සේවා ආඥාවක් බලපවත්නා කාලය මුළුල්ලේ ම ආඥාවට අනුව කටයුතු කරනු ලබන්නේ ද නැතහොත් කර තිබේ ද යනවග සඳහන් කරමින් වරදකරු කරනු ලැබූ තැනැත්තාගේ පැමිණීම සහ වැඩ පිළිබඳ වාර්තාවක් ඒ ආඥාව සටහන් කළ ප්‍රාථමික අධිකරණය වෙත සෑම මාසයක් පාසා ම ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, ඒ වාර්තාව ඒ කාරණා පිළිබඳව අවසානාත්මක හා තීරණාත්මක විය යුතු ය.

13. (1) ප්‍රාථමික අධිකරණයක් විසින් වරදකරුවකු විෂයයෙහි බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයක් කරනු ලබන අවස්ථාවක, ඒ දණ්ඩන නියමය ඒ ආඥාවේ දින සිට මාස දහ අටක කාල සීමාවක් ඇතුළත බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් කරනු ලැබිය හැකි වෙනත් වරදක් ඒ වරදකරු විසින් සිදු කරනු ලැබුවහොත් මිස, ක්‍රියාත්මක නොවිය යුතු යයි අධිකරණය විසින් ආඥා කරනු ලැබිය හැකි ය. අත්හිට වූ බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමය.

(2) ප්‍රාථමික අධිකරණයක් විසින් මේ පනතේ (1) වන උපවගන්තිය යටතේ ආඥාවක් කරනු ලබන අවස්ථාවක, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතෙහි 303 වන වගන්තියේ (1) වන සහ (2) වන උපවගන්තිවල විධිවිධාන හැර අත්හිට වූ බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයන්ට අදාළ ඒ පනතේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඒ ආඥාවට අදාළ විය යුතු අතර මේ වගන්තියේ (1) වන උපවගන්තියෙහි සඳහන් මාස දහ අටක කාලසීමාව ඒ කාර්යය සඳහා ඒ විධිවිධානවල සඳහන් “ක්‍රියාත්මක වන කාලය” ලෙස සලකනු ලැබිය යුතු ය.

එක් නඩු විභාගයක දී වැරදි කිහිපයක් සඳහා වරද කරු කරනු ලැබූ විට දණ්ඩන නියමය.

**14.** (1) යම් වෙනස් වැරදි දෙකක් හෝ ඊට වැඩි ගණනක් සම්බන්ධයෙන් එක් නඩු විභාගයක දී යම් තැනැත්තකු වරදකරු කරනු ලැබූ විට, ඒ වැරදි සඳහා නියම කරනු ලැබ ඇති හා නියම කිරීමට අධිකරණයට බලය ඇති විවිධ දඬුවම් ප්‍රාථමික අධිකරණය විසින් (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව ඒ වැරදි සම්බන්ධයෙන් ඒ තැනැත්තාට නියම කළ හැකි ය. ඒ දඬුවම් බන්ධනාගාරගත කිරීමේ දඬුවම්වලින් සමන්විත වන අවස්ථාවක ඒ දඬුවම් හෝ ඉන් කිසිවක් සමගාමීව ගත විය යුතු යයි අධිකරණය ආඥා කරතහොත් මිස, අධිකරණය විසින් විධාන කරනු ලබන අනු පිළිවෙළට එකක් ඉකුත් වූ විට අනික වශයෙන් ආරම්භ විය යුතු ය:

එසේ වුව ද ඒ මුළු දඬුවම, ස්වකීය සාමාන්‍ය අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී නියම කිරීමට ඒ අධිකරණයට බලය ඇති දඬුවමෙහි ප්‍රමාණය මෙන් දෙගුණයක් නොඉක්මවිය යුතු ය.

(2) එක් නඩු විභාගයක දී වැරදි කීපයක් සඳහා වරදකරු කරනු ලැබූ විටක, මේ වගන්තිය යටතේ කරන ලද මුළු දණ්ඩන නියම අභියාචන කාර්යය සඳහා තනි දණ්ඩන නියමයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) කවර වූ හෝ ආකාරයේ සියලුම වැරදි සම්බන්ධයෙන්, දණ්ඩ නීති සංග්‍රහයේ 55 වන සහ 67 වන වගන්තිවල විධිවිධාන අදාළ විය යුතු ය.

චෝදනාව නිස්සාර හෝ පීඩාකාරී විට ගාස්තු සහ වන්දි ගෙවීම.

**15.** ප්‍රාථමික අධිකරණයක් චූදිතයා නිදොස් කරමින් හෝ නිදහස් කරමින් චෝදනාව නිස්සාර හෝ පීඩාකාරී යයි ප්‍රකාශ කරන කවර විටෙක වුව ද—

(අ) රුපියල් පණහක් නොඉක්මවන මුදලක් රජයේ ගාස්තුව වශයෙන් ගෙවන ලෙස, සහ

(ආ) චූදිතයාට හෝ එක් චූදිතයකුට වැඩි චූදිතයන් ගණනක් සිටිතහොත් ඒ එක් එක් චූදිතයාට වන්දි වශයෙන් රුපියල් පණහක් නොඉක්මවන මුදලක් ගෙවන ලෙස

ඒ අධිකරණය විසින් චෝදනාකරුට ආඥා කිරීම නීත්‍යනුකූල විය යුතු ය.

වරදකරු කරනු ලැබූ විට වන්දි ගෙවීම.

**16.** යම් තැනැත්තකු යම් වරදක් සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබූ කවර විටක වුව ද, නැතහොත් චෝදනාව ඔප්පු වූ බව ප්‍රාථමික අධිකරණයක් විසින් තීරණය කරන නමුදු වරද කළ තැනැත්තා වරදකරු නොකර ඔහු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට එය කටයුතු කරන අවස්ථාවක දී, රුපියල් දෙසියයක් නොඉක්මවන යම් මුදලක් අධිකරණය විධාන කරන යම් කාලයක් ඇතුළත හෝ

එසේ විධාන කරන යම් වැරිකවලින් වරදින් හානියට පත් වූ ද සුදුසු යයි අධිකරණයට පෙනී යන්නා වූ ද යම් තැනැත්තකුට වන්දි වශයෙන් ගෙවන ලෙස අධිකරණය විසින් වරදකරුට ආඥා කළ හැකි ය. මේ වගන්තිය යටතේ හා 15 වන වගන්තිය යටතේ ප්‍රදානය කරනු ලබන යම් මුදලක් අධිකරණය විසින් නියම කරන ලද දඩයක් වූවාක් මෙන් අයකර ගනු ලැබිය හැකි විය යුතු ය :

එසේ වුව ද වරදකරු වයසින් අවුරුදු දහසයට අඩු නම් සුදුසු යයි අධිකරණය කල්පනා කරතහොත් මේ වගන්තිය යටතේ වූ ගෙවීම ඒ වරදකරුගේ පියා/මව හෝ භාරකරු විසින් කළ යුතු යයි අධිකරණය විසින් ආඥා කළ හැකි ය.

17. ප්‍රාථමික අධිකරණයක් විසින් දඩයක් නියම කරනු ලබන හෝ දඩයක් කොටසක් වන දණ්ඩන නියමයක් කරනු ලබන කවර විටක වුව ද, අය කර ගනු ලබන දඩයේ මුළු මුදල ම හෝ එහි යම් කොටසක් හෝ වරදින් හානියට පත් තැනැත්තාට ගෙවන ලෙස අධිකරණය විසින් ආඥා කළ හැකි ය.

ගෙවන ලද දඩය හෝ එහි කොටසක් හෝ වරදින් හානියට පත් පාර්ශ්වකරුට ගෙවන ලෙස අධිකරණය විසින් ආඥා කළ හැකි බව.

18. ප්‍රාථමික අධිකරණයක් විසින් චෝදනාව ඔප්පු වී ඇතැයි තීරණය කරන නමුත් චෝදනා නගනු ලැබූ තැනැත්තාගේ චරිතය, පූර්ව ක්‍රියා කලාපය, වයස, සෞඛ්‍ය තත්ත්වය හෝ මානසික තත්ත්වය හෝ වරද සිදු කරනු ලැබුවේ යම් මන්දීකාරක කරුණු යටතේ ද ඒ මන්දීකාරක කරුණු සැලකිල්ලට ගෙන යම් දඬුවමක් දීම හෝ නාම මාත්‍ර දඬුවමක් නොවන දඬුවමක් දීම අවස්ථෝචිත නොවන බව හෝ මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති පරිදි වරදකරු කොන්දේසි පිට නිදහස් කිරීම අවස්ථාවෝචිත බව අධිකරණයේ මතය වන කවර විටක වුව ද අධිකරණය විසින් වරද කරු කිරීමක් සඳහා ක්‍රියා නොකොට—

වරදකරුවන් කොන්දේසි පිට මුදාහැරීම සඳහා අවසර දීමට අධිකරණයට ඇති බලය.

(අ) සුදුසු යයි අධිකරණයට පෙනී යන අවවාදයකින් පසු ඒ වරදකරු නිදහස් කරන ලෙස ආඥා කළ හැකි ය ;

(ආ) රජයේ ගාස්තු වශයෙන් රුපියල් පණහක් නොඉක්මවන මුදලක් ගෙවන ලෙස ඒ වරදකරුට ආඥා කළ හැකි ය ;

(ඇ) 16 වන වගන්තිය යටතේ වන්දි ගෙවන ලෙස ආඥා කළ හැකි ය ;

(ඇ) යහපත් හැසිරීමෙන් කල් යවන බවටත් අධිකරණයේ ආඥාවෙහි සඳහන් කරනු ලබන මාස දහඅටක් නොඉක්ම වන යම් කාලයක් තුළ කවර හෝ අවස්ථාවක දී වරදකරු කිරීම හා දණ්ඩන නියමය සඳහා පෙනී සිටින ලෙස නියම කළ විට පෙනී සිටින බවටත් ඇපකරුවන් ඇතිව හෝ නැතිව බැඳුම් ඔප්පුවකට ඇතුළත් වූ විට වරදකරු කොන්දේසි පිට නිදහස් කළ හැකි ය ;

(ඉ) වරදකරු සම්බන්ධයෙන්, වරදකරුවන් පරිවාසයෙහි තැබීමේ ආඥාපනතෙහි විධිවිධාන යටතේ ක්‍රියා කළ හැකි ය.

බැඳුම් ඇප්පුවේ කොන්දේසි.

19. 18 වන වගන්තිය යටතේ වූ බැඳුම් ඇප්පුවක, නඩුවේ විශේෂ අවස්ථාගත කරුණු සැලකිල්ලට ගෙන පහත දැක්වෙන කාරණා සියල්ලම හෝ ඉන් යම් කිසිවක් සම්බන්ධයෙන් එයට ඇතුළත් කරනු ලැබිය යුතු යයි අධිකරණය විසින් ආඥා කරනු ලබන කොන්දේසි ඇතුළත් විය හැකි ය :—

(අ) සොරුන් සහ අනෙකුත් නොමනා තැනැත්තන් ඇසුරු කිරීම හෝ නොමනා ස්ථානවල ගැවසීම වරදකරුට තහනම් කිරීම ;

(ආ) කරන ලද වරද බීමත්ව සිටීම හෝ බීමත්ව සිටි විටක සිදු කරන ලද වරදක් වූ අවස්ථාවක, මත්පැන් පානයෙන් වැළැකීම ;

(ඇ) වරදකරු අවංක හා කාර්යශීලී ජීවිතයක් ගත කරන බවට සාමාන්‍යයෙන් වග බලා ගැනීම ;

(ඈ) තමාගේ ඇපකරුවකු හෝ ඇපකරුවන් වෙතොත් ඔවුන් ද සමග ආඥාවෙහි සඳහන් යම් කාලසීමා අතර දී ප්‍රාථමික අධිකරණයේ විනිශ්චයකාරවරයාගේ පෞද්ගලික කාමරයේ දී ඔහු ඉදිරියෙහි වරදකරුට පෙනී සිටීමට සැලැස්වීම ;

(ඉ) 16 වන සහ 18 වන වගන්තිවල විධිවිධාන සලස්වා ඇති පරිදි වන්දි සහ රජයේ ගාස්තු ගෙවන ලෙස විධාන කිරීම.

බැඳුම් ඇප්පුවේ කොන්දේසි වෙනස් කිරීමට ඇති බලය.

20. වරදකරු කිරීම සහ දණ්ඩන නියමය සඳහා පෙනී සිටීමට මේ පනත යටතේ සිය බැඳුම් ඇප්පුවෙන් යම් තැනැත්තකු බැඳුනේ යම් අධිකරණයක් ඉදිරියේ දී ද ඒ අධිකරණය විසින් බැඳුම් ඇප්පුවේ කොන්දේසි වෙනස් කළ හැකි අතර, ඒ තැනැත්තාගේ හැසිරීම බැඳුම් ඇප්පුව අවලංගු කිරීමට තරම් වන තත්ත්වයකින් පැවති බවට අධිකරණය සෑහීමට පත් වුවහොත් අධිකරණය විසින් බැඳුම් ඇප්පුව ද අවලංගු කළ හැකි ය.

වරදකරු බැඳුම් ඇප්පුවේ කොන්දේසි අනුව ක්‍රියා කිරීම පැහැර හරින අවස්ථාවක් සම්බන්ධයෙන් විධිවිධානය.

21. (1) වරදකරු කිරීම සහ දණ්ඩන නියමය සඳහා පෙනී සිටීමට 18 වන වගන්තිය යටතේ සිය බැඳුම් ඇප්පුවෙන් යම් වරදකරුවකු බැඳුනේ යම් අධිකරණයක් ඉදිරියේ දී ද ඒ අධිකරණය විසින් එයට ලැබුණු තොරතුරු අනුව වරදකරු ඔහුගේ බැඳුම් ඇප්පුවේ කොන්දේසි කිසිවක් අනුව ක්‍රියා කිරීම පැහැර හැර ඇති බවට සෑහීමට පත් වුව හොත් වරදකරුට සහ ඔහුගේ (ඇපකරුවන් කිසිවකු වෙතොත්) ඇපකරුවන්ට ද අධිකරණය ඉදිරියෙහි පැමිණ සිටීම සඳහා අධිකරණය විසින් සිතාසියක් නිකුත් කළ හැකි ය.

(2) ඒ සිතාසි පිට වරදකරු සහ ඔහුගේ (ඇපකරුවන් කිසිවකු වෙතොත්) ඇපකරුවන් පමුණුවා ගත නොහැකි වුවහොත් අධිකරණය විසින් ඒ කාර්යය සඳහා වරෙන්තුවක් නිකුත් කළ හැකි ය.

(3) වරදකරු කිරීම සහ දණ්ඩන නියමය සඳහා පෙනී සිටීමට වරදකරුවකු සිය බැඳුම් ඇප්පුවෙන් බැඳුනේ යම් අධිකරණයක් ඉදිරියේ දී ද, ඒ අධිකරණය ඉදිරියේ ඒ වරදකරු පෙනී සිටි විට හෝ එය ඉදිරියට ඔහු පමුණුවනු ලැබූ විට ඔහුගේ බැඳුම් ඇප්පුවේ යම් කොන්දේසියක් අනුව ක්‍රියා කිරීම ඔහු විසින් පැහැර හැර ඇති බවට ලඝු ආකාරයෙන් පවත්වනු ලබන පරීක්ෂණයකින් පසුව ඒ

අධිකරණය සෑහීමට පත් වුවහොත් ඒ අධිකරණය විසින් මුල් වරද සම්බන්ධයෙන් ඔහු වහාම වරදකරු කොට ඔහුට දණ්ඩන නියමය කළ හැකි ය; එසේ නැතහොත් ඒ නඩුව ළමයින් හා තරුණයින් පිළිබඳ ආඥාපනත යටතේ වරදකරු අනුමත හෝ සහතික කළ පාසලකට යවන ලෙස ප්‍රථම වතාවේ දී ම අධිකරණය විසින් ආඥා කළ හැකිව තුබුණු නඩුවක් නම් සහ වරදකරු තවමත් වයසින් අවුරුදු දහසයට අඩු ලෙස පෙනේ නම්, අධිකරණය විසින් එවැනි ආඥාවක් කළ හැකි ය.

22. වයසින් අවුරුදු දහසයකට අඩු පිරිමි තැනැත්තකුට දඩයක් හෝ බන්ධනාගාරගත කිරීමක් නියම කිරීම වෙනුවට ශාරීරික දඬුවම් ආඥාපනතෙහි සහ 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 294 වන වගන්තියෙහි විධිවිධාන අනුව ඒ තැනැත්තාට කස පහර දීමට ප්‍රාථමික අධිකරණයක් විසින් ආඥා කළ හැකි ය: ඇතැම් අවස්ථාවල දී කස පහර දීම.

එසේ වුව ද එවැනි කිසිම තැනැත්තකුට සැහැල්ලු වේවැලකින් පහරවල් හයකට වඩා දෙන ලෙස ආඥා කිරීමට ප්‍රාථමික අධිකරණයක විනිශ්චයකාරවරයකුට බලය නොතිබිය යුතු ය.

23. (1) යම් තැනැත්තකුට දණ්ඩන නියමය වශයෙන් දඩයක් පමණක් හා දඩය ගෙවීම පැහැර හැරීමේ දී බන්ධනාගාරගත කිරීමක් නියම කර ඇති අවස්ථාවක පහත සඳහන් සියල්ල ම හෝ ඉන් යම් කිසිවක් හෝ ප්‍රාථමික අධිකරණයක් විසින් කළ හැකි ය:— දඩය වාරිකවලින් ගෙවිය හැකි බව.

(අ) දඩය ගෙවීම සඳහා කල් දීම;

(ආ) දඩය වාරිකවලින් ගෙවන ලෙස විධාන කිරීම;

(ඇ) දඩය හෝ එහි යම් වාරිකයක් හෝ ගෙවීම සම්බන්ධයෙන් අධිකරණය සෑහීමට පත් වන පරිදි, ඇපකරුවකු හෝ ඇප කරුවන් ඇතිව හෝ නැතිව, බැඳුම්කරයක් දීමට දඩය ගෙවීමට යටත් තැනැත්තාට නිදහස ඇති බව විධාන කිරීම.

(2) දඩයක් වාරිකවලින් ගෙවන ලෙස විධාන කරනු ලැබූ හා එහි එක් වාරිකයක් ගෙවීම පැහැර හරිනු ලැබූ අවස්ථාවක, ඒ වන විට නොගෙවා ඉතිරිව ඇති සියලුම වාරික ගෙවීම පැහැර හරින ලද්දේ නම් ක්‍රියා කරනු ලැබිය හැකි ආකාරයෙන් ම ඒ සම්බන්ධයෙන් කටයුතු කළ හැකි ය.

## III වන කොටස

### අපරාධ නඩු පවරන අන්දම

24. ප්‍රාථමික අධිකරණයක් විසින් නඩු විභාග කළ හැකි වරදක් සම්බන්ධයෙන් වූ සෑම අපරාධ නඩුවක් ම හෝ නඩු කටයුත්තක් ම වරද සිදු කරන ලද්දේ යම් ප්‍රාථමික අධිකරණයක ප්‍රාදේශීය අධිකරණ බල සීමාව ඇතුළත ද ඒ ප්‍රාථමික අධිකරණයෙහි පවරනු ලැබිය යුතු ය: අපරාධ නඩු පවරන අන්දම.

එසේ වුව ද යම් වරදකින් කොටසක් යම් ප්‍රාථමික අධිකරණයක ප්‍රාදේශීය සීමා ඇතුළත ද කොටසක් වෙනත් ප්‍රාථමික අධිකරණයක ප්‍රාදේශීය සීමා ඇතුළත ද සිදුකර ඇති අවස්ථාවක, ඒ වරද සම්බන්ධ යෙන් වූ අපරාධ නඩුවක් හෝ නඩු කටයුත්තක් ඒ අධිකරණ අතුරින් කවර හෝ අධිකරණයක පවරනු ලැබිය හැකි ය.

ප්‍රාථමික අධිකරණයක් හි නඩු කටයුතු පැවරීම.

25. (1) චෝදනාකරු විසින් යථා පරිදි අත්සන් කරනු ලැබූ ලිඛිත චෝදනාවක් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් හෝ යැවීමෙන් ප්‍රාථමික අධිකරණයක අපරාධ නඩුවක් හෝ නඩු කටයුත්තක් පවරනු ලැබිය හැකි ය; එසේ නැතහොත්, චෝදනාකරු විසින් ස්වකීය නඩුවේ කරුණු ඒ අධිකරණයේ විනිශ්චයකාරවරයාට වාචිකව පැවසිය හැකි අතර ඒ විනිශ්චයකාරවරයා විසින් එය ලියවිල්ලකට නඟා එයට චෝදනාකරුගේ අත්සන ලබා ගැනීම හෝ එය ලියවිල්ලකට නඟා අත්සන ලබා ගැනීමට සැලැස්වීම හෝ කරනු ලැබිය යුතු ය. එසේ ලියා ගනු ලැබූ ප්‍රකාශය නඩුවෙහි චෝදනාව විය යුතු ය:

එසේ වුව ද චෝදනාකරු පළාත් පාලන ආයතනයක් වන අවස්ථාවක ඒ පළාත් පාලන ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයා විසින් හෝ ඒ පළාත් පාලන ආයතනය වෙනුවෙන් පෙනී සිටීමට යථා පරිදි බලය දෙනු ලැබූ ඒ පළාත් පාලන ආයතනයේ යම් නිලධරයකු විසින් හෝ ඒ චෝදනාව අත්සන් කරනු ලැබිය හැකි ය. මේ අනුරු වගන්තියෙහි " පළාත් පාලන ආයතනය " යන්නෙහි, ශ්‍රී ලංකා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවෙහි ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය.

(2) එවැනි සෑම චෝදනාවක් ම දින යොදා අධිකරණයේ මුද්‍රාවෙන් මුද්‍රා තබා එය ලැබුණු අනුපිළිවෙල අනුව අංක කරනු ලැබිය යුතු අතර ඒ පිළිබඳ නඩු කටයුතුවල ආරම්භය එය විය යුතු ය.

සිතාසි හෝ වරෙන්තු නිකුත් කිරීම.

26. (1) ප්‍රාථමික අධිකරණයක නඩු කටයුතු පවරනු ලැබූ අවස්ථාවක ඉන් වරදක් එළිදරව් වේ නම්, චූදිත තැනැත්තා හෝ තැනැත්තන් ඒ වන විට අධිකරණය ඉදිරියේ නොසිටිනහොත්, ඒ තැනැත්තාට හෝ තැනැත්තන්ට අධිකරණය විසින් සිතාසි නිකුත් කළ යුතු ය.

(2) සිතාසි භාර දෙනු ලැබිය නොහැක්කේ නම් හෝ චූදිත තැනැත්තා හෝ තැනැත්තන් පැනගොස් සැඟ වී සිටිත් නම් හෝ පැනගොස් සැඟ වී සිටීමට ඉඩ ඇත් නම් අධිකරණය විසින් වරෙන්තුවක් නිකුත් කළ හැකි ය.

අධිකරණ නියෝග නිකුත් කිරීමට අධිකරණයට ඇති බලය.

27. මහේස්ත්‍රාත් අධිකරණයක පවරනු ලබන නඩු සම්බන්ධයෙන් 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතෙහි විධිවිධාන සලස්වා ඇති ආකාරයට හැකිනාක් අනුකූලව සෑම ප්‍රාථමික අධිකරණයකට ම, ස්වකීය අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා එම අධිකරණය ඉදිරියෙහි චෝදනා ලැබ සිටින තැනැත්තන් වෙත හා පැමිණ සිටීම අවශ්‍ය යයි අධිකරණය සලකන සාක්ෂිකරුවන් හා වෙනත් තැනැත්තන් වෙත සිතාසි, වරෙන්තු හා වෙනත් අධිකරණ නියෝග නිකුත් කිරීමේ ද ලේඛන ඉදිරිපත් කිරීමට බල කිරීමේ ද සම්පූර්ණ බලය තිබිය යුතු ය.

චූදිතයා පෙනී සිටි විට කාර්ය පටිපාටිය.

28. (1) චූදිතයා පෙනී සිටි විට ප්‍රාථමික අධිකරණයේ විනිශ්චයකාරවරයා විසින්—

(අ) චෝදනාවෙහි විස්තර පදනම් කොට ගත් චෝදනාවක් සකස් කළ යුතු ය; තව ද

(ආ) ඔහුට චෝදනාව කියවා පැහැදිලි කර දී එයට විරුද්ධව දැක්වීමට හේතු තිබේදැයි ඔහුගෙන් විමසිය යුතු අතර ඔහු නිරවශේෂ වරද පිළිගැනීමක් කරන්නේ නම් දණ්ඩන නියමය හෝ නීතිය අනුව වෙනත් ආඥාවක් හෝ කළ යුතු ය.

(2) චූදිතයා නිරවශේෂ වරද පිළිගැනීමක් නොකරන්නේ නම් නැතහොත් උත්තරවාද දීම ප්‍රතික්ෂේප කරන්නේ නම් හෝ නිවරදකරු යයි උත්තරවාද දෙන්නේ නම් විනිශ්චයකාරවරයා විසින් 31 වන වගන්තියෙහි දැක්වෙන ආකාරයට ක්‍රියා කරගෙන යා යුතු ය.

චෝදනාව අස්කර ගැනීම.

29. (1) තීන්දු ප්‍රකාශය දීමට පෙර කවර අවස්ථාවක දී වුව ද චෝදනාකරු විසින් චෝදනාව අස්කර ගැනීම පිණිස මෝසමක් ඉදිරිපත් කිරීම නීත්‍යනුකූල විය යුතු අතර එසේ කරනු ලැබූ විට විනිශ්චයකාරවරයා විසින් ඒ මෝසමට ඉඩ දී චූදිතයා නිදොස් කළ යුතු ය.

චෝදනාකරු පැමිණ නොසිටීම.

(2) විභාග කිරීම සඳහා හෝ වෙනත් යම් කාර්යයක් සඳහා විවෘත අධිකරණයේ දී නඩුව කැඳවනු ලැබූ දිනයක හේතුවක් නොමැතිව චෝදනාකරු පැමිණ නොසිටියහොත් වෙනත් යම් දිනයකට නඩුව කල් තැබීම සුදුසු යයි විනිශ්චයකාරවරයා කල්පනා කරතහොත් මිස ප්‍රාථමික අධිකරණයේ විනිශ්චයකාරවරයා විසින් චූදිතයා නිදොස් කළ හැකි ය. එසේ කල් තැබීමට ආඥා කරනු ලැබූ විට රුපියල් පණහක් නොඉක්මවන මුදලක් චූදිතයාට ගාස්තු වශයෙන් ගෙවන ලෙස විනිශ්චයකාරවරයා විසින් ආඥා කළ හැකි ය:

එසේ වුව ද චෝදනාකරු යුක්තිසහගත කාලයක් ඇතුළත පෙනී සිට තමාගේ නොපැමිණීම අසනීපයක්, හදිසි අනතුරක් හෝ තමාට මැඩ පැවැත්විය නොහැකි වෙනත් යම් හේතුවක් නිසා සිදු වූ බවට විනිශ්චයකාරවරයා සෑහීමට පත් කරතහොත් ඒ විනිශ්චයකාරවරයා විසින් මේ උපවගන්තිය යටතේ කරන ලද යම් ආඥාවක් අවලංගු කළ යුතු ය.

(3) තීන්දු ප්‍රකාශය දීමට පෙර කවර හෝ විටක ලිඛිතව වාර්තාගත කරනු ලැබිය යුතු හේතු මත විනිශ්චයකාරවරයා විසින් චූදිතයා නිදහස් කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, එසේ නිදහස් කිරීමට පෙර විනිශ්චයකාරවරයා විසින් සිය අභිමතය පරිදි නීතිපතිවරයා විමසිය හැකි ය.

නඩු කටයුතු වාර්තාව ඉල්ලා සිටි විට ප්‍රාථමික අධිකරණය විසින් එය නීතිපතිවරයා වෙත යැවිය යුතු බව.

30. යම් අපරාධ නඩුවක නඩු විභාගයක් තමා ඉදිරියෙහි පවත්වනු ලැබුවේ ද නැතහොත් පවත්වනු ලබන්නේ ද ඒ අපරාධ නඩුවේ නඩු කටයුතු වාර්තාව නීතිපතිවරයා විසින් ලියවිල්ලකින් ඉල්ලනු ලැබූ විටක, ප්‍රාථමික අධිකරණයක විනිශ්චයකාරවරයා විසින් ඒ නඩු කටයුතු වාර්තාව නොපමාව නීතිපතිවරයා වෙත යැවිය යුතු ය:

එසේ වුව ද ඒ වාර්තාව තමා වෙත ලැබීමෙන් පසු එක් මාසයකට වැඩි කාලයක් ඉකුත් වීමට පෙර නීතිපතිවරයා විසින් ඒ වාර්තාව ඒ අධිකරණය වෙත ආපසු යවනු ලැබිය යුතු ය.

විභාගයේ දී කාර්ය පටිපාටිය.

31. (1) චෝදනාව ගැන වාචිකව විභාග කිරීමත්, සුදුසු අවස්ථාවල පාර්ශ්වකරුවන් සමාදාන බේරුම් කිරීමකට ගෙන ඒමට සියලු නීත්‍යනුකූල ක්‍රමවලින් උත්සාහ දැරීමත් ප්‍රාථමික අධිකරණයේ විනිශ්චයකාරවරයාගේ කාර්යය විය යුතු ය. පාර්ශ්වකරුවන් ඒ වරද හෝ වැරදි සමථයට පත් කර ගැනීමට එකඟ වුවහොත් වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන්ව ඇතද, එසේ කිරීමට විනිශ්චයකාරවරයා විසින් ඔවුන්ට ඉඩ දිය යුතු අතර නඩුව සමථයට පත් කරන ලද්දේ යම් නියම මත ද ඒ නියම විනිශ්චයකාරවරයා විසින් වාර්තාගත කළ යුතු ය. ඉක්බිති, චූදිතයා ඒ නියම අනුව ක්‍රියා කළ පසු ඒ බව වාර්තාගත කොට චූදිතයා නිදොස් කළ යුතු ය.

(2) නඩුව සමථයට පත්කර ගැනීමට පාර්ශ්වකරුවන් ප්‍රතික්ෂේප කරන්නේ නම් විනිශ්චයකාරවරයා විසින් නඩුව විභාග කරගෙන යා යුතු ය.

නීතිඥ නියෝජනය.

32. සෑම චූදිත තැනැත්තකුට ම හා සෑම චෝදනාකරුවකුට ම නීතිඥවරයකු විසින් තමා නියෝජනය කරනු ලැබීමට හිමිකම් තිබිය යුතු ය:

එසේ වුව ද ස්වකීය නිල තත්ත්වයෙන් චෝදනාවක් ඉදිරිපත් කර ඇති රජයේ නිලධරයකුට, නීතිපතිවරයා හෝ රජයේ නීතිඥවරයකු විසින් හෝ නීතිපතිවරයා විසින් විශේෂයෙන් හෝ සාමාන්‍යයෙන් බලය දෙන ලද යම් නීතිඥවරයකු හෝ විසින් තමා නියෝජනය කරනු ලැබීමට හිමිකම තිබිය යුතු ය. එහෙත් එවැනි නියෝජනය කිරීමක් නොමැති විට රජයේ නිලධරයා ම විසින් හෝ අපරාධ චෝදනාවෙහි ලා සම්බන්ධතාවක් ඇති දෙපාර්තමේන්තුවෙහි වෙනත් යම් රජයේ නිලධරයකු විසින් හෝ අධිකරණයේ අවසරය ඇතිව නීතිඥවරයකු විසින් හෝ අපරාධ චෝදනාව මෙහෙයවනු ලැබිය හැකි ය:

එසේ ම තවදුරටත්, යම් මහ නගර සභාවක්, නගර සභාවක්, සුළු නගර සභාවක් නැතහොත් ගම් සභාවක් සම්බන්ධතාවක් දක්වන්නේ යම් නඩුවක් සම්බන්ධයෙන් ද ඒ නඩුවේ චෝදනාව මෙහෙයවීම පිණිස ඒ මහ නගර සභාවේ, නගර සභාවේ, සුළු නගර සභාවේ නැතහොත් ගම් සභාවේ නිලධරයකු පෞද්ගලිකව හෝ නීතිඥවරයකු මගින් හෝ පෙනී සිටිය හැකි ය.

නඩු විභාගයේ දී කාර්ය පටිපාටිය.

33. (1) ප්‍රාථමික අධිකරණයක පැවැත්වෙන නඩු විභාගය, මහෙස්ත්‍රාත් අධිකරණයෙහි නඩු විභාග සඳහා 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතෙහි විධිවිධාන සලස්වා ඇති ආකාරයට පවත්වනු ලැබිය යුතු ය.

(2) ප්‍රාථමික අධිකරණයක සෑම නඩු තීන්දුවකට ම 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතෙහි 279 වන සහ 283 වන වගන්තිවල විධිවිධාන අදාළ විය යුතු අතර ප්‍රාථමික අධිකරණයක් විසින් නියම කරනු ලබන බන්ධනාගාරගත කිරීමේ සෑම දණ්ඩන නියමයකට ම ඒ පනතේ 289 වන සහ 290 වන වගන්තිවල විධිවිධාන අදාළ විය යුතු ය.

34. (1) ප්‍රාථමික අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද යම් ලේඛනයක් හෝ වෙනත් දේපළ බැහැර කිරීම සම්බන්ධයෙන් අධිකරණය සුදුසු යයි කල්පනා කරන ආඥාවක් නඩු විභාගයේ ඕනෑම අවස්ථාවක දී ඒ අධිකරණය විසින් කළ හැකි ය.

ලේඛන සහ ඉදිරිපත් කරන ලද දේ බැහැර කිරීම.

(2) අභියාචනයක් ඉදිරිපත් කළ හැකි නඩුවක දී (1) වන උප වගන්තිය යටතේ ආඥාවක් කරනු ලැබූ විට, ඒ අභියාචනය ඉදිරිපත් කිරීම සඳහා ඉඩ දී ඇති කාලය ගත වන තෙක් හෝ ඒ කාලය ඇතුළත අභියාචනය ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක දී ඒ අභියාචනය සම්බන්ධයෙන් සුදුස්සක් කරනු ලබන තෙක් (එකී දේපළ ඇති කරන සතුන් හෝ ඉක්මණින් සහ ස්වභාවයෙන් නරක් වන සුළු දේපළක් වූ විට හැර) ඒ ආඥාව ක්‍රියාත්මක කරනු නොලැබිය යුතු ය.

අභියාචනය අවසන් වන තෙක් බැහැර කිරීමේ ආඥාව නතර කිරීම.

35. වරද සිදු කරන ලද ස්ථානය හෝ වරද සිදු කරන ලදැයි කියනු ලබන්නේ යම් දේපළක් සම්බන්ධයෙන් ද ඒ දේපළ පරීක්ෂා කිරීමේ අවස්ථාවක් තමාට ලැබෙන තුරු ප්‍රාථමික අධිකරණයක විනිශ්චයකාරවරයා විසින් අවශ්‍ය යයි ඔහු සලකන්නේ නම් පාර්ශ්වකරුවන් පෙනී සිටීමෙන් පසු කවර හෝ අවස්ථාවක දී නඩු විභාගය පැවැත්වීම අඛාලව කල් තැබිය හැකි ය. ඒ පරීක්ෂණයේ වේලාව සහ ස්ථානය පිළිබඳ දැන්වීමක් විනිශ්චයකාරවරයා විසින් පාර්ශ්වකරුවන් වෙත යථා පරිදි දිය යුතු අතර, පරීක්ෂණයේ දී පැමිණ සිටීමට පාර්ශ්වකරුවන්ට හිමිකම් ඇති බව දැන්වීමෙහි සඳහන් විය යුතු ය.

ස්ථානය පරීක්ෂා කිරීම.

36. වැඩබලන විනිශ්චයකාරවරයකු සඳහා කටයුතු පිළියෙල කරනු නොලැබ ප්‍රාථමික අධිකරණයක විනිශ්චයකාරවරයකු පැමිණ නොමැති විටක, විනිශ්චයකාරවරයා නොපැමිණෙන කාලය තුළ අධිකරණය ඉදිරියේ විභාගයට නියමිතව තිබිය හැකි සියලුම නඩු, ඒවා මේ කොටස හෝ IV වන කොටස හෝ යටතේ පවරා තිබුණ ද, කැඳවා වෙනත් යම් දිනයකට කල් තැබීමට ඒ අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාට බලය තිබිය යුතු ය.

විනිශ්චයකාරවරයා පැමිණ නොසිටීම.

## IV වන කොටස

## සිවිල් නඩු පවරන අන්දම

නඩුව පැවරීම.

37. යම් නීතියකින් නියම කරනු ලැබ ඇති මුදල පිළිබඳ වූ හෝ වෙනත් සීමා කිරීම්වලට යටත්ව, පැමිණිලිකරු හෝ විත්තිකරු හෝ පැමිණිලිකරුවන් නැතහොත් විත්තිකරුවන් දෙදෙනකු හෝ ඊට වැඩි ගණනක් සිටින අවස්ථාවක, ඔවුන් අතුරින් එක් තැනැත්තකු හෝ පදිංචිව සිටින්නේ යම් අධිකරණයක ප්‍රාදේශීය අධිකරණ බල සීමාව තුළ ද ඒ ප්‍රාථමික අධිකරණයෙහි නඩුව පවරනු ලැබිය හැකි ය.

පැමිණිල්ල ඉදිරිපත් කිරීම.

38. සරල සහ සංක්ෂිප්ත භාෂාවෙන් ලියා පැමිණිලිකරු විසින් යථා පරිදි අත්සන් කරනු ලැබූ ලිඛිත ප්‍රකාශයක් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් හෝ යැවීමෙන් ප්‍රාථමික අධිකරණයක නඩුවක් පවරනු ලැබිය හැකි ය. එසේ නැතහොත්, පැමිණිලිකරු විසින් ස්වකීය නඩුවේ කරුණු ඒ අධිකරණයේ විනිශ්චයකාරවරයාට වාචිකව පැවසිය හැකි අතර විනිශ්චයකාරවරයා විසින් එය ලිය විල්ලකට නගා එයට පැමිණිලිකරුගේ අත්සන ලබා ගැනීමට හෝ එසේ ලියවිල්ලකට නගා පැමිණිලිකරුගේ අත්සන ලබා ගැනීමට සැලැස්වීම හෝ කළ යුතු ය. එසේ ලියා ගනු ලැබූ ප්‍රකාශය හෝ අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද හෝ යවන ලද ප්‍රකාශය නඩුවෙහි පැමිණිල්ල වශයෙන් සලකනු ලැබිය යුතු ය.

උත්තරවාද.

39. ප්‍රාථමික අධිකරණයක උත්තරවාද පහත සඳහන් කරුණු වලට සීමා විය යුතු ය :—

(අ) පැමිණිලිකරුගේ පැමිණිල්ල;

(ආ) විත්තිකරුගේ උත්තරය සහ (කිසියම් හරස් ඉල්ලීමක් වේ නම්) හරස් ඉල්ලීම;

(ඇ) විත්තිකරුගේ හරස් ඉල්ලීමට පැමිණිලිකරුගේ පිළිතුර.

එහෙත් කිසිදු හරස් ඉල්ලීමක් නොමැති අවස්ථාවක උත්තර යෙන් බාහිර වැඩි දුර උත්තරවාද නොවිය යුතු ය.

පැමිණිල්ල අංක කළ යුතු බව.

40. පාර්ශ්වකරුවන්ගේ නම් හා පදිංචි ස්ථාන ද පැමිණිල්ල ඉදිරිපත් කළ දිනය ද පැමිණිල්ලෙහි තිබිය යුතු අතර පැමිණිල්ල ඉදිරිපත් කළ අනුපිළිවෙල අනුව එය අංක කරනු ලැබිය යුතු ය.

කවර නඩු නිමිති එක් කළ හැකි ද යන වග.

41. (අ) නඩුවට අදාළ වූ විෂයට ම සම්බන්ධ එකම කටයුත්තෙන් හෝ කටයුතුවලින් ; නැතහොත්

(ආ) එකම විත්තිකරුට හෝ විත්තිකරුවන්ට විරුද්ධව නඩු නිමිති දෙකක් හෝ ඊට වැඩි ගණනක් පැන නැගෙන විට පැමිණිලිකරු විසින් එකම පැමිණිල්ලෙහි ඒ නඩු නිමිති දෙක හෝ ඊට වැඩි ගණන එක් කළ හැකි ය.

එහෙත් එසේ එක් කරනු ලබන සියලු ම නඩු නිමිති එකකට එකක් අනුකූල බව ද ඒවායින් එකම අන්දමේ සහනයක් සඳහා පැමිණිලිකරුට හිමිකම් ලැබෙන බව ද සියලු ම පාර්ශ්වකරුවන් කෙරෙහි ඒවා බලපාන බව ද පැමිණිල්ලෙන් පැහැදිලිව පෙනී යා යුතු ය.

42. ඉහත කී පරිදි ඒ පැමිණිල්ල ඉදිරිපත් කරනු ලැබූ කල්හි ප්‍රාථමික අධිකරණය විසින් විත්තිකරුගේ පෙනී සිටීම සඳහා දිනයක් නියම කොට ඒ පිළිබඳව පැමිණිලිකරුට දැනුම්දිය යුතු ය; තව ද විත්තිකරුගේ පෙනී සිටීම සඳහා සිතාසියක් ද නිකුත් කළ යුතු ය. සිතාසි නිකුත් කළ යුතු බව.

### පෙනී සිටි විට නඩු කටයුතු

43. (1) සිතාසියෙහි සඳහන් ස්ථානයේ දී හා දිනයේ දී පැමිණිලිකරුගේ හිමිකම් පෑම පිළිගන්නා ලෙස හෝ ප්‍රතික්ෂේප කරන ලෙස විත්තිකරුගෙන් ඉල්ලා සිටිය යුතු ය. විත්තිකරු පෙනී සිට හිමිකම් පෑම පිළිගත යුතු හෝ ප්‍රතික්ෂේප කළ යුතු බව.

(2) විත්තිකරු හිමිකම් පෑම පිළිගතහොත් ප්‍රාථමික අධිකරණයේ විනිශ්චයකාරවරයා විසින් ඒ පිළිගැනීම නඩු වාර්තාවෙහි ඇතුළත් කළ යුතු අතර එය අත්සන් කිරීමට විත්තිකරුට නියම කොට පැමිණිලිකරුගේ වාසියට නඩු තීන්දුව සටහන් කළ යුතු ය: විත්තිකරු හිමිකම් පෑම පිළිගන්නේ නම්.

එසේ වුව ද පහසුවෙන් අධිකරණය වෙත පැමිණ සිටිය නොහැකි විත්තිකරුවකු විසින් තමා දන්නා නීතිඥවරයකු ඉදිරිපිට දී හා ඔහුගේ සහතික කිරීම යටතේ තමා විසින් අත්සන් කොට තම පිළිගැනීම අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කිරීම නීත්‍යනුකූල විය යුතු අතර ඒ පිළිගැනීම ලැබී ඇතුළත් කරනු ලැබීමෙන් පසු ප්‍රාථමික අධිකරණයේ විනිශ්චයකාරවරයා විසින් ඒ අනුව පැමිණිලිකරුගේ වාසියට නඩු තීන්දුව සටහන් කළ යුතු ය.

(3) විත්තිකරු හිමිකම් පෑම ප්‍රතික්ෂේප කරතහොත් ප්‍රාථමික අධිකරණයේ විනිශ්චයකාරවරයා විසින් නඩු විභාග—පූර්ව විභාගයක් සඳහා නඩුව අඩ ගසනු ලැබීමට නියම කළ යුතු ය. විත්තිකරු හිමිකම් පෑම ප්‍රතික්ෂේප කරන්නේ නම්.

(4) නඩු විභාගයේ පූර්ව විභාගය සඳහා නියම කරන ලද දිනයේ දී පාර්ශ්වකරුවන් සමාදාන කර ආරාවුල බේරුම් කිරීම සඳහා සුදුසු කවර අවස්ථාවල දී වුව ද ප්‍රාථමික අධිකරණයේ විනිශ්චයකාරවරයා සෑම නීත්‍යනුකූල අන්දමකින් ම උත්සාහ දැරිය යුතු ය.

44. (1) නඩු කටයුතුවල මේ අවස්ථාවේ දී— පාර්ශ්ව කරුවන් විභාග කිරීම.

(i) පාර්ශ්වකරුවන් අතර විවාදාභිමුඛ කරුණු නිසැකව දැන ගැනීමේ හා අනවශ්‍ය සාක්ෂි අත්හැර දැමීමේද

(ii) පාර්ශ්වකරුවන් සමාදාන බේරුම් කිරීමකට පෙළඹවීමේ හා ඔවුන් අතර වූ මතභේදයේ හේතුව ඉවත් කොට ඔවුන් සමාදාන කිරීමේ ද

අදහසින් ප්‍රාථමික අධිකරණයේ විනිශ්චයකාරවරයා විසින් පාර්ශ්වකරුවන් වාචිකව විභාග කරනු ලැබිය හැකි ය.

(2) පාර්ශ්වකරුවන් සමාදාන කිරීමට දරන ලද සෑම නීත්‍යානුකූල උත්සාහයක් ම අසාර්ථක වුවහොත් අධිකරණය විසින් විත්තිකරුට උත්තර බැඳීම සඳහා දිනයක් නියම කළ යුතු ය. අවශ්‍ය වෙනස් කිරීම් සහිතව 38 වන වගන්තියෙහි දැක්වෙන ආකාරයට උත්තර බැඳීම කළ යුතු ය.

**හරස් ඉල්ලීම පිළිබඳව.**

45. විත්තිකරු ඔහුගේ උත්තරයත් සමග හරස් ඉල්ලීමක් කරතහොත් එය පිළිගන්නා ලෙස හෝ ප්‍රතික්ෂේප කරන ලෙස පැමිණිලිකරුගෙන් ඉල්ලා සිටිය යුතු ය. පැමිණිලිකරු හරස් ඉල්ලීම ප්‍රතික්ෂේප කරතහොත් වහාම හෝ අධිකරණය නියම කරන වැඩි දුර කාලයක දී ඒ සම්බන්ධයෙන් උත්තරවාද දෙන ලෙස පැමිණිලිකරුට නියම කරනු ලැබිය යුතු අතර, විත්තිකරුගේ හරස් ඉල්ලීමට පැමිණිලිකරු දෙන පිළිතුර සම්බන්ධයෙන්, අදාළ විය හැකි තාක් දුරට, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, 38 වන වගන්තියෙහි විධිවිධාන අදාළ විය යුතු ය :

**එයට දෙන පිළිතුර පිළිබඳව.**

එසේ වුව ද පැමිණිලිකරු විසින් අලුත් නඩු නිමිත්තක් වන අලුත් කාරණයක්, එය ඔහුගේ මුල් පැමිණිල්ලෙහි ඉදිරිපත් කරනු ලැබිය හැකිව තිබුණ කාරණයක් නම්, ස්වකීය පිළිතුරෙහි නොදැක්විය යුතු ය.

**නඩුව, නඩු විභාගය සඳහා නියම කිරීම.**

46. උත්තරය ඉදිරිපත් කරනු ලැබීමෙන් පසු හෝ උත්තරයෙහි හරස් ඉල්ලීමක් එළිදරව් වේ නම් එයට පැමිණිලිකරු විසින් යම් පිළිතුරක් දෙනු ලැබුවහොත් එය ඉදිරිපත් කිරීමෙන් පසු ප්‍රාථමික අධිකරණයේ විනිශ්චයකාරවරයා විසින් නඩුව, නඩු විභාගය සඳහා නියම කළ යුතු ය.

**නොවැදගත් වෙනස්කම් නොසලකා හැරිය යුතු බව.**

47. උත්තරවාදයක දැක්වෙන කියා පෑමක් හා එය ඔප්පු කිරීම හා අතර වෙනසක් දක්නා ලද විට, ඒ ඔප්පු කිරීමෙන් අලුත් නඩු නිමිත්තක් එළිදරව් වන්නේ නම් මිස, නැතහොත් විරුද්ධ පාර්ශ්වකරු ඔහුගේ අවාසියට එමගින් නොමග යැවී ඇතැයි අධිකරණය සෑහීමට පත් වන්නේ නම් මිස, ඒ වෙනස වැදගත් නැතැයි නොසලකා හරිනු ලැබිය යුතු ය.

**නීතිඥ නියෝජනය.**

48. නඩුවක හෝ නඩු කටයුත්තක සෑම පාර්ශ්වකරුවකුට ම නීතිඥවරයකු මගින් පෙනී සිටීමේ හිමිකම තිබිය යුතු ය.

**නඩු විභාගයේදී කාර්ය පටිපාටිය.**

49. නඩු විභාගයේ දී, පාර්ශ්වකරුවන්ගෙන් ප්‍රශ්න කිරීමෙන් සහ ඔවුන් භේද වී සිටින කාරණා නිසැකව දැන ගැනීමෙන් පසු අධිකරණය විසින් නඩුව පිළිබඳ නිවැරදි තීරණය රඳා පවත්නේ යයි පෙනී යන විසඳිය යුතු කරුණු සකස් කළ යුතු ය. විසඳිය යුතු කරුණු, උත්තරවාද හා ඉදුරා අනුකූල වීම අවශ්‍ය නොවිය යුතු

අතර විසඳිය යුතු කරුණු මගින් අලුත් ප්‍රශ්නයක් මතු වීමේ ප්‍රතිඵලයක් වශයෙන් අවශ්‍ය වුව හොත් අධිකරණය විසින් විරුද්ධ පාර්ශ්වකරුට අඩාළව කල් තැබීමකට ඉඩ දිය හැකි ය. එහෙත් උත්තරවාද සංශෝධනයකට ඉඩ දෙනු නොලැබිය යුතු ය.

විසඳිය යුතු කරුණු සකස් කිරීම.

**50.** (1) දිසා අධිකරණයක සාමාන්‍ය ක්‍රමයේ නඩු සඳහා සිවිල් නඩු විධාන සංග්‍රහයෙහි නියමිත ආකාරයට, නඩු විභාගය පවත්වනු ලැබිය යුතු ය.

(2) නඩු තීන්දුවලට හා තීන්දු ප්‍රකාශවලට සහ තීන්දු ප්‍රකාශ ක්‍රියාවේ යෙදවීමට අදාළ සිවිල් නඩු විධාන සංග්‍රහයෙහි විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ප්‍රාථමික අධිකරණයක නඩු තීන්දු සහ තීන්දු ප්‍රකාශ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

හරස් ඉල්ලීම.

**51.** යම් ප්‍රාථමික අධිකරණයක් ඉදිරියෙහි පැවැත්වෙන යම් නඩු කටයුත්තක දී විත්තිකරුගේ යම් විත්තිවාචකයකට හෝ හරස් ඉල්ලීමකට ඒ අධිකරණයේ අධිකරණ බල සීමාවෙන් පිටත යම් කාරණයක් සම්බන්ධ වී ඇති අවස්ථාවක, පැමිණිලිකරුගේ ඉල්ලීමට හා ඒ සම්බන්ධ විත්තිවාචකයට අදාළ වන තාක් දුරට විවාදෝත්ගත කාරණය සම්බන්ධයෙන් සුදුස්සක් කිරීමෙහි ලා අධිකරණය සතු බලය හෝ අධිකරණයට අයත් කාර්යය හෝ කෙරෙහි ඒ විත්තිවාචකය හෝ හරස් ඉල්ලීම බල නොපෑ යුතු ය. එහෙත් ඒ අධිකරණය විසින් දෙනු ලැබීමට අධිකරණයට අධිකරණ බලය ඇති සහනයක් ඉක්මවන කිසිදු සහනයක් එවැනි යම් හරස් ඉල්ලීමක් මත විත්තිකරුට දෙනු නොලැබිය යුතු ය:

එසේ වුව ද එවැනි අවස්ථාවක දී නඩු කටයුතුවල යම් පාර්ශ්වකරුවකුගේ ඉල්ලීම පිට අභියාචනාධිකරණය හෝ එහි යම් විනිශ්චයකාරවරයකු විසින්, ඒ අධිකරණය හෝ විනිශ්චයකාරවරයා සුදුසු යයි කල්පනා කරතහොත්, නඩුව පවරනු ලැබ තිබූ අධිකරණයේ සිට විවාදෝත්ගත මුළු කාරණය ම විෂයයෙහි අධිකරණ බලය ඇති දිසා අධිකරණය වෙත ඒ නඩුව මාරු කළ යුතු යයි විධාන කිරීම නීත්‍යනුකූල විය යුතු ය. තව ද එසේ මාරු කරනු ලැබූ විට ප්‍රාථමික අධිකරණයේ විනිශ්චයකාරවරයා විසින් ආඥාවෙහි සඳහන් දිසා අධිකරණය වෙත නඩු වාර්තාව යැවිය යුතු අතර ඒ නඩු කටයුත්ත ඒ දිසා අධිකරණයෙහි දී මුලින් ආරම්භ කරනු ලැබ තිබුණක් මෙන් එහි දී එය වැඩිදුරටත් පවත්වා ගෙන යාම ද මෙහෙයවීම ද කරනු ලැබිය යුතු ය.

සාක්ෂිකරුවන් කැඳවීමට හා වරෙන්තු නිකුත් කිරීමට ඇති බලය.

**52.** (1) ප්‍රාථමික අධිකරණයක් විසින් නඩු විභාග කරනු ලබමින් හෝ විභාග කරනු ලබමින් පවතින නඩු නිමිති සම්බන්ධයෙන් සියලුම සාක්ෂිකරුවන් කැඳවා විභාග කිරීමේ ද යම් පාර්ශ්වකරුවකු හෝ සාක්ෂිකරුවකු අල්ලා ගැනීම සහ අධිකරණය වෙත ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය වුවහොත් වරෙන්තු නිකුත් කිරීමේ ද ඔවුන් සම්බන්ධයෙන් නීතියට අනුව ක්‍රියා කිරීමේ ද අධිකරණ බලය ඒ අධිකරණයට තිබිය යුතු ය.

එසේ ම යම් ලේඛනයක් හෝ දෙයක් අධිකරණය වෙත ඉදිරිපත් කරන ලෙස හෝ ඉදිරිපත් කිරීමට සලස්වන ලෙස යම් පාර්ශ්වකරුවකුට හෝ සාක්ෂිකරුවකුට හෝ වෙනත් තැනැත්තකුට ආඥා කිරීමේ අධිකරණ බලය ද එයට තිබිය යුතු ය. එහෙත් එසේ ආඥා කළ හැකි වීමට ඒ ලේඛනය හෝ දෙය ඉදිරිපත් නොකිරීමට අවසර දෙන කිසිදු බාධාවක් හෝ වරප්‍රසාදයක් තත් කාලයෙහි වලංගුව බල පවත්නා වෙනත් යම් නීතියක් යටතේ නොතිබිය යුතු ය.

(2) සිතාසි සහ වරෙන්තු සම්බන්ධයෙන් සිවිල් නඩු විධාන සංග්‍රහයෙහි විධිවිධාන මේ වගන්තියේ (1) වන උපවගන්තිය හා 42 වන වගන්තිය යටතේ නිකුත් කරනු ලබන සිතාසි හා වරෙන්තු සම්බන්ධයෙන් අදාළ විය හැකි තාක් දුරට අදාළ විය යුතු ය.

## පෙනී සිටීම පැහැර හැරීම

*පැමිණිලිකරු පෙනී සිටීම පැහැර හැරි විට කටයුතු.*

53. (1) විත්තිකරුගේ පෙනී සිටීම සඳහා සිතාසියෙහි සඳහන් කරන ලද දිනයෙහි හෝ නඩුව විභාග කිරීම සඳහා නියමිත යම් දිනයක හෝ පැමිණිලිකරු පෙනී නොසිටියහොත් හෝ තමාගේ නොපැමිණීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් ලෙස නිදහසට කරුණු නොදක්වුව හොත් පැමිණිලිකරුගේ නඩුව නිෂ්ප්‍රභ කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද විත්තිකරු පෙනී සිටියහොත් සහ 43 වන වගන්තිය යටතේ ඉල්ලා සිටි විට පැමිණිලිකරුගේ හිමිකම් පෑම ඔහු පිළිගත හොත් ප්‍රාථමික අධිකරණයේ විනිශ්චයකාරවරයා විසින් නීතියට අනුව පැමිණිලිකරුගේ වාසියට නඩු තීන්දුව සටහන් කළ යුතු ය.

*විත්තිකරු පෙනී සිටීම පැහැර හැරි විට කටයුතු.*

(2) සිතාසියෙහි සඳහන් කරන ලද දිනයෙහි හෝ නඩුව විභාග කිරීම සඳහා නියමිත යම් දිනයක හෝ පැමිණිලිකරු පෙනී සිටින අතර විත්තිකරු පෙනී නොසිටියහොත් හෝ තමාගේ නොපැමිණීම සම්බන්ධයෙන් ඔහු ප්‍රමාණවත් ලෙස නිදහසට කරුණු නොදක්වුව හොත් ප්‍රාථමික අධිකරණයේ විනිශ්චයකාරවරයා විසින්, ඒ පෙනී සිටීම නියම කරමින් නිකුත් කරන ලද සිතාසිය, දැන්වීම හෝ ආඥාව භාර දුන් බව යථා පරිදි ඔප්පු වූ විට, පැහැර හැරීමේ හේතුවෙන් විත්තිකරුට විරුද්ධව නඩු තීන්දුව සටහන් කළ හැකි ය.

*පැහැර හැරීමේ හේතුවෙන් දුන් නඩු තීන්දුව ඇතැම් අවස්ථාවල දී සමාලෝචනය කළ හැකි බව.*

(3) ඒ නඩු තීන්දුවෙන් පසු යුක්ති සහගත කාලයක් ඇතුළත, විත්තිකරු විසින්, පැමිණිලිකරුට දැන්වීමක් සහිතව දිවුරුම් පත්‍රයක් මගින් හෝ අන්‍යාකාරයකින් නියමිත කාලයේ දී පෙනී සිටීමෙන් තමා වැළැක්වුණේ හදිසි අනතුරක්, අභාග්‍යයක් හෝ වෙනත් නොවැළැක්විය හැකි හේතුවක් නිසා නැතහොත් නඩු කටයුතු පිළිබඳ ප්‍රමාණවත් තොරතුරු තමාට නොලැබුණු නිසා බව ද, සිතාසිය හෝ දැන්වීම භාරදීම මග හැරීමේ කාර්යය සඳහා තමා නොපැමිණ නොසිටි බවට ද නඩුවේ යථායෝග්‍යතා පිළිබඳ මනා හා වලංගු විත්ති වාචකයක් තමාට ඇති බවට ද ප්‍රාථමික අධිකරණයේ විනිශ්චයකාරවරයා සෑහීමට පත් කරතහොත්, එවිට ඒ නඩු තීන්දුව හා ඒ මත ගන්නා ලද පියවර කිසිවක් වේ නම් ඒ පියවර ද අවලංගු කිරීම ද තමා සුදුසු යයි කල්පනා කරන නියම මත විත්තිකරුට ඔහුගේ විත්ති වාචකය පවත්වා ගෙන යාමට අවසර දීම ද විනිශ්චයකාරවරයා විසින් කළ හැකි ය.

(4) සිතාසියෙහි සඳහන් කරන ලද දිනයෙහි හෝ නඩුව විභාග කිරීම සඳහා නියමිත යම් දිනයක හෝ නඩුව කැඳවනු ලැබූ විට පාර්ශ්වකරුවන් දෙදෙනාගෙන් එක ද පාර්ශ්වකරුවකුවත් පෙනී නොසිටියහොත් ප්‍රාථමික අධිකරණයේ විනිශ්චයකාරවරයා විසින් පැමිණිලිකරුගේ නඩුව නිෂ්ප්‍රභ කරමින් නඩු තීන්දුව සටහන් කළ යුතු ය. එහෙත් එය ගාස්තු රහිතව විය යුතු ය.

පාර්ශ්වකරුවන් දෙදෙනාගෙන් එක ද පාර්ශ්ව කරුවකුවත් පෙනී නොසිටි විට නඩුව නිෂ්ප්‍රභ කළ යුතු බව.

(5) (1) වන උපවගන්තියේ හෝ (4) වන උපවගන්තියේ විධි විධාන යටතේ නඩුවක් නිෂ්ප්‍රභ කරනු ලැබුවා වූ ද, විත්තිකරු විසින් පැමිණිලිකරුට දැන්වීමක් සහිතව, දිවුරුම් පත්‍රයක් මගින් හෝ අන්‍යාකාරයකින්, පෙනී සිටීමෙන් තමා වැළැක්වූණේ හදිසි අනතුරක්, අභාග්‍යයක් හෝ වෙනත් නොවැළැක්විය හැකි හේතු වක් නිසා බවට ප්‍රාථමික අධිකරණයේ විනිශ්චයකාරවරයා සෑහීමට පත් කරන්නාවූ ද අවස්ථාවක, අධිකරණය විසින් නියම කරනු ලබන නියම මත, අලුත් නඩුවක් පැවරීමට විනිශ්චයකාරවරයා විසින් පැමිණිලිකරුට අවසර දිය හැකි ය. එසේ අවසර දෙන ලද අවස්ථා වක (1) වන උපවගන්තිය හෝ (4) වන උපවගන්තිය හෝ යටතේ නිෂ්ප්‍රභ කරන ලද නඩුව, අලුත් නඩුවක් පැවරීමට බාධකයක් ලෙස ක්‍රියාත්මක නොවිය යුතු ය.

අලුත් නඩුවක් පැවරීමට පැමිණිලිකරුට අවසර දිය හැකි බව.

(6) මේ පනතෙහි හෝ වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන්ව ඇත ද පැහැර හැරීම හේතුකොටගෙන මේ වගන්තිය යටතේ සටහන් කරන ලද යම් නඩු තීන්දුවකට හෝ ආඥාවකට හෝ විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කළ නොහැකි විය යුතු ය.

පැහැර හැරීමේ හේතුවෙන් දෙන ලද නඩු තීන්දුවකට හෝ ආඥාවකට විරුද්ධව අභියාචනයක් කළ නොහැකි බව.

## V වන කොටස

### ප්‍රාථමික අධිකරණවලින් අභියාචනාධිකරණය වෙත අභියාචන

54. (1) (4) වන උපවගන්තියට යටත්ව, ප්‍රාථමික අධිකරණයක නඩු තීන්දුවකට, වරදකරු කිරීමකට, දණ්ඩන නියමයකට, තීන්දු ප්‍රකාශයකට හෝ අවසාන ආඥාවකට විරුද්ධව ඉදිරිපත් කෙරෙන සෑම අභියාචනයක් ම පෙත්සමකින් විය යුතු අතර, (5) වන උප වගන්තියෙහි අන්‍යාකාරයෙන් විධිවිධාන සලස්වා ඇති පරිදි හැර, අභියාචනය කරනු ලබන්නේ යම් නඩු තීන්දුවකට, වරදකරු කිරීම කට, දණ්ඩන නියමයකට, තීන්දු ප්‍රකාශයකට හෝ අවසාන ආඥාව කට විරුද්ධව ද එය සටහන් කරනු ලැබූ දිනයේ සිට දින දහ හතරක් ඇතුළත, ප්‍රාථමික අධිකරණයේ විනිශ්චයකාරවරයා වෙත ඒ අභියාචන පෙත්සම ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

අභියාචන.

(2) ඒ අභියාචන පෙත්සම ලියවිල්ලකින් විය යුතු ය. තව ද අභියාචනයේ හේතු එහි කෙටියෙන් ප්‍රකාශ විය යුතු අතර අභියාචක විසින් හෝ ඔහුගේ නීතිඥවරයා විසින් හෝ එය අත්සන් කළ යුතු ය.

(3) එවැනි සෑම අභියාචන පෙත්සමක ම රුපියල් පහක වටිනාකම ඇති මුද්දරයක් විය යුතු නමුදු නීතිපතිවරයා අභියාචක වන අවස්ථාවක ඒ මුද්දරය අවශ්‍ය නොවිය යුතු ය.

(4) නීතිපතිවරයාගේ ඉල්ලීම පිට හෝ ඔහුගේ ලිඛිත කැමැත්ත ඇතිව හැර ප්‍රාථමික අධිකරණයේ විනිශ්චයකාරවරයකු විසින් කරන ලද නිදොස් කිරීමකට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කළ නොහැකි විය යුතු ය.

(5) යම් අපරාධ නඩුවක දී හෝ කාරණයක දී ප්‍රාථමික අධිකරණයක් විසින් ප්‍රකාශ කරන ලද යම් නඩු තීන්දුවකට, දණ්ඩන නියමයකට හෝ අවසාන ආඥාවකට විරුද්ධව නීතිපතිවරයා අභියාචනයක් ඉදිරිපත් කරන අවස්ථාවක හෝ අභියාචනය නිදෙස් කිරීමකට විරුද්ධව නීතිපතිවරයාගේ කැමැත්ත ඇතිව කරනු ලබන්නක් වූ අවස්ථාවක, යම් කාලයක් ඇතුළත ඒ අභියාචන පෙත්සම ඉදිරිපත් කළ යුත්තේ ද ඒ කාලය, එකී නඩු තීන්දුව, දණ්ඩන නියමය හෝ ආඥාව සටහන් කරන ලද දිනයේ සිට විසි අට දවසක් විය යුතු ය.

අභියාචනය ලැබුණු විට කාර්ය පටිපාටිය.

55. (1) ප්‍රාථමික අධිකරණයේ විනිශ්චයකාරවරයා විසින් අභියාචන පෙත්සම ලැබුණු දිනය එය මතුපිට සහතික කොට, මුද්දරය අවලංගුකර, හැකි තාක් අප්‍රමාදව ඒ අභියාචන පෙත්සම සහ නඩු වාර්තාව අභියාචනාධිකරණය වෙත යැවීමට සැලැස්විය යුතු ය.

(2) අභියාචනය ඉදිරිපත් කරන ලද්දේ යම් නඩු තීන්දුවකට, දණ්ඩන නියමයකට හෝ අවසාන ආඥාවකට විරුද්ධව ද ඒ නඩු තීන්දුව, දණ්ඩන නියමය හෝ අවසාන ආඥාව අනුව අභියාචක බන්ධනාගාරගත කරනු ලැබ සිටියේ නම්, ඔහු සිය අභියාචනය ඉදිරිපත් කළ වහාම, නිවේදනය කරනු ලබන යම් දිනයක ඔහුට ප්‍රාථමික අධිකරණය ඉදිරියේ පෙනී සිටීම සඳහා සහ අභියාචනයේ දී කරනු ලබන ආඥාව අනුව ක්‍රියා කිරීම සඳහා ඔහු ඇප පිට මුදා හරිනු ලැබිය යුතු ය. නියම කරනු ලබන ඇපය සැපයීමට ඒ අභියාචක අපොහොසත් වුවහොත් ඔහු බන්ධනාගාර අධිකාරිවරයකුගේ භාරයේ සිරභාරයේ තබනු ලැබිය හැකිය.

අභියාචන නඩු පොත පිළියෙල කිරීම.

56. (1) නඩු වාර්තාව ලැබුණු විට, අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින් අභියාචනය අංක කොට, ලේඛනගත කර, නඩු වාර්තාවේ සහ අභියාචන පෙත්සමේ ප්‍රමාණවත් පිටපත් සංඛ්‍යාවක් පිළියෙල කිරීමට සැලැස්විය යුතු ය. ඉන්පසු ඒ අභියාචනය අභියාචන ලැයිස්තුවෙහි ඇතුළත් කළ යුතු අතර ඒ අභියාචනය විභාග කරන දිනය පිළිබඳව අභියාචකට සහ අනෙක් පාර්ශ්වකරුවන්ට යටත් පිරිසෙයින් එක් මාසයක දැනුම්දීමක් කළ යුතු දිනයක එය විභාගයට ගනු ලැබිය යුතු ය.

(2) වචන සියයකින් යුත් සෑම පත් ඉරුවකටම ශත විසිපහ බැගින් ගෙවීමෙන් නඩු වාර්තාවේ සහ අභියාචන පෙත්සමේ පිටපතක් ලබා ගැනීමට අභියාචනයේ පාර්ශ්වකරුවන්ට හිමිකම තිබිය යුතු ය:

එසේ වුව ද නීතිපතිවරයාට නඩු වාර්තාවේ සහ අභියාචන පෙත්සමේ ඔහුගේ පිටපත කිසිදු අයකිරීමක් නොමැතිව නොමිලේ නිකුත් කරනු ලැබිය යුතු ය.

**අභියාචනය විභාග කිරීම.**

57. (1) විභාගයේ දී සියලුම පාර්ශ්වකරුවන්ට පෞද්ගලිකව පෙනී සිටීමට හෝ තම තමන්ගේ නීතිඥවරයන් විසින් තමන් නියෝජනය කරනු ලැබීමට හිමිකම තිබිය යුතු ය.

(2) අභියාචනය විභාගයට ගනු ලැබූ විට අභියාචක පැමිණ සිටී නම් පළමු කොට ඔහුට අභියාචනය තහවුරු කිරීම සඳහා කරුණු ඉදිරිපත් කිරීමට ඉඩ දිය යුතු අතර, ඉන් පසු, වගඋත්තරකරු පැමිණ සිටි නම්, ඔහුට ඊට විරුද්ධව කරුණු ඉදිරිපත් කිරීමට ඉඩ දිය යුතු ය.

(3) ස්වකීය අභියාචනය තහවුරු කිරීම සඳහා අභියාචක පෙනී නොසිටියහොත් අභියාචනාධිකරණය විසින් අභියාචනය සලකා බැලිය යුතු අතර සුදුසු යයි අධිකරණයට පෙනී යන ආඥාවක් ඒ සම්බන්ධයෙන් කළ හැකි ය.

**අභියාචනය සම්බන්ධයෙන් අභියාචනාධිකරණය සතු බලතල.**

58. අභියාචනය මත අභියාචනාධිකරණය විසින්—

(අ) අපරාධ නඩුවක දී—

(i) විරුද්ධව අභියාචනය කරන ලද නඩු තීන්දුව, වරද කරු කිරීම, දණ්ඩන නියමය හෝ අවසාන ආඥාව ස්ථිර කර අභියාචනය නිෂ්ප්‍රභ කළ හැකි ය; නැතහොත්

(ii) අභියාචනයට ඉඩ දී, විරුද්ධව අභියාචනය කරන ලද නඩු තීන්දුව, වරදකරු කිරීම, දණ්ඩන නියමය හෝ අවසාන ආඥාව අවලංගු කොට, නැවත නඩු විභාගයක් පවත්වන ලෙස ආඥා කිරීම හෝ අභියාචක නිදොස් කිරීම හෝ උචිත විය හැකි වෙනත් ආඥාවක් හෝ කළ හැකි ය; නැතහොත්

(iii) විරුද්ධව අභියාචනය කරන ලද නඩු තීන්දුව, වරද කරු කිරීම, දණ්ඩන නියමය හෝ අවසාන ආඥාව වෙනස් කිරීම හෝ දණ්ඩන නියමය අඩු හෝ වැඩි හෝ කිරීම නැතහොත් එහි ස්වභාවය වෙනස් කිරීම හෝ කළ හැකි ය; දණ්ඩන නියමය වැඩි කරනු ලැබූ අවස්ථාවක, ඒ දණ්ඩන නියමය ප්‍රාථමික අධිකරණයක් විසින් නියම කළ හැකි දණ්ඩන නියමය කට වඩා වැඩි නොවිය යුතු ය; නැතහොත්

(iv) අභියාචනය, නිදොස් කිරීමේ ආඥාවකට විරුද්ධව කරනු ලැබුවක් වන අවස්ථාවක, ඒ ආඥාව ප්‍රතිවර්තනය කොට, අලුත් නඩු විභාගයක් පවත්වන ලෙස ආඥා කළ හැකි ය.

(ආ) සිවිල් නඩුවක දී—

(i) නඩු තීන්දුව, තීන්දු ප්‍රකාශය හෝ ආඥාව ස්ථිර කොට, අභියාචනය නිෂ්ප්‍රභ කළ හැකි ය; නැතහොත්

(ii) අභියාචනයට ඉඩ දී නඩු තීන්දුව, තීන්දු ප්‍රකාශය හෝ ආඥාව අවලංගු කළ හැකි ය; නැතහොත්

(iii) නඩු තීන්දුව, තීන්දු ප්‍රකාශය හෝ ආඥාව වෙනස් කළ හැකි ය; තව ද

(iv) යුක්තිසහගත යයි අධිකරණයට පෙනී යන මුදලක් ගාස්තු වශයෙන් ගෙවන ලෙස ආඥා කළ හැකි ය.

අභියාචනයේ නඩු තීන්දුව විවෘත අධිකරණයේ දී දිය යුතු බව.

59. (1) අභියාචනයේ විභාගය අවසාන වූ විට ඒ අවස්ථාවේ ම හෝ නඩු තීන්දුව දීමේ කාර්යය සඳහා ඒ වේලෙහි නියම කරනු ලැබිය යුතු යම් මතු දිනයක හෝ අභියාචනාධිකරණය විසින් විවෘත අධිකරණයේ දී නඩු තීන්දුව ප්‍රකාශ කළ යුතු ය.

(2) එසේ නියම කරන ලද දිනයේ දී නඩු තීන්දුව ප්‍රකාශ කිරීමට අධිකරණය සූදානම් නැත් නම්, ඒ සඳහා තවත් පසු දිනයක් නියම කර ප්‍රකාශ කරනු ලැබිය හැකි ය.

(3) වෙනත් විනිශ්චයකාරවරයකු ලියා අත්සන් කළ, එහෙත් ප්‍රකාශ නොකරන ලද, නඩු තීන්දුවක් විනිශ්චයකාරවරයකු විසින් ප්‍රකාශ කරනු ලැබිය හැකි ය.

අභියාචනාධිකරණයේ ආඥාව ප්‍රාථමික අධිකරණය වෙත සහතික කර යැවිය යුතු බව.

60. (1) අභියාචනයක් මත නඩුවක් තීරණය කරනු ලැබූ කවර හෝ විටක, අභියාචනාධිකරණය විසින් එහි ආඥාව ස්වකීය මුද්‍රාව යටතේ ප්‍රාථමික අධිකරණය වෙත සහතික කොට යැවිය යුතු අතර, ආඥාව සඳහා දෙන ලද හේතුවල පිටපතක් සමග නඩු වාර්තාව සහ අභියාචන පෙත්සම ද ඒ අධිකරණය වෙත ආපසු යැවිය යුතු ය.

(2) අභියාචනාධිකරණයේ ආඥාව සහතික කර යවන ලද්දේ යම් ප්‍රාථමික අධිකරණයක් වෙත ද එවිට ඒ ප්‍රාථමික අධිකරණය විසින්, එසේ සහතික කර එවනු ලැබූ ආඥාවට අනුකූල වන ආකාරයේ ආඥාවක් කළ යුතු අතර, අවශ්‍ය නම් නඩු වාර්තාව ඒ අනුව සංශෝධනය කළ යුතු ය.

අභියාචන නතරවීම.

61. අපරාධ නඩුවක සෑම අභියාචනයක් ම චූදිතයාගේ මරණය සිදු වූ විට අවසාන වශයෙන් නතර විය යුතු ය.

අභියාචනාධිකරණය විසින් නඩු වාර්තාව ගෙන්වා ආඥාවක් කළ හැකි බව.

62. (1) ප්‍රාථමික අධිකරණයක එවකටත් නඩු විභාග කොට ඇති නැතහොත් විනිශ්චයට භාජනව පවත්නා යම් නඩුවක දී කරන ලද යම් දණ්ඩන නියමයක හෝ ආඥාවක නීත්‍යානුකූලතාව හෝ යෝග්‍යතාව පිළිබඳව හෝ ඒ අධිකරණයේ නඩු කටයුතුවල ක්‍රමවත්භාවය පිළිබඳව අභියාචනාධිකරණය සෑහීමට පත්වීමේ කාර්යය සඳහා අභියාචනාධිකරණය විසින්, සිය මෙහෙයවීමෙන් ම හෝ අතෘප්තියට පත් යම් පාර්ශ්වකරුවකුගේ ඉල්ලීමක් මත, ඒ නඩුවේ නඩු වාර්තාව ගෙන්වා පරීක්ෂා කළ හැකි ය.

(2) එවැනි යම් නඩුවක දී 58 වන වගන්තියෙහි සඳහන් ආඥා අතුරින් කවර හෝ ආඥාවක් අභියාචනාධිකරණය විසින් කළ හැකි ය.

(3) පෞද්ගලිකව හෝ ස්වකීය නීතිඥවරයාගේ මාර්ගයෙන් හෝ කරුණු ඉදිරිපත් කිරීමේ අවස්ථාවක් චූදිතයාට ලැබී ඇත්නම් මිස චූදිතයාට හානිකර ආඥාවක් අපරාධ නඩුවක දී මේ වගන්තිය යටතේ නො කරනු ලැබිය හැකි ය.

(4) නිදොස් කිරීමේ තීරණයක් වරදකරු කිරීමේ තීරණයක් බවට හැරවීමට මේ වගන්තියෙහි වූ කිසිවකින් අභියාචනාධිකරණ යට බලය ලැබෙතැයි අර්ථ නිරූපණය කරනු නොලැබිය යුතු ය.

(5) මෙහි මීන් පෙර විධිවිධාන සලස්වා ඇති පරිදි හැර, අභියා චනාධිකරණය විසින් ස්වකීය ප්‍රතිශෝධන බලතල ක්‍රියාත්මක කිරීමේ දී ඒ අධිකරණය ඉදිරියේ පෞද්ගලිකව හෝ නීතිඥවරයකු ගේ මාර්ගයෙන් හෝ කරුණු ඉදිරිපත් කිරීමේ කිසිදු අයිතිවාසි කමක් පාර්ශ්වකරුවකුට නොතිබිය යුතු ය:

එසේ වුව ද, අධිකරණය ඒ බලතල ක්‍රියාත්මක කිරීමේ දී අධිකරණය සුදුසු යයි කල්පනා කරතහොත් පෞද්ගලිකව හෝ නීතිඥවරයකු මගින් හෝ කරුණු ඉදිරිපත් කිරීමට යම් පාර්ශ්ව කරුවකුට ඉඩ දිය හැකි ය.

(6) ස්වකීය ප්‍රතිශෝධන බලතල ක්‍රියාත්මක කිරීමේ දී අභියා චනාධිකරණය විසින් කරනු ලබන ආඥා සම්බන්ධයෙන් 60 වන වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

63. මේ කොටස යටතේ අභියාචනයක් ඉදිරිපත් කළ යුත්තේ යම් කාලසීමාවක් ඇතුළත ද ඒ කාලසීමාව ගණන් ගැනීමේ දී, අභියාචනය කරනු ලබන්නේ යම් නඩු තීන්දුවකට, තීන්දු ප්‍රකාශ යකට, දණ්ඩන නියමයකට, වරදකරු කිරීමකට නැතහොත් අවසාන ආඥාවකට විරුද්ධව ද, ඒ නඩු තීන්දුව, තීන්දු ප්‍රකාශය, දණ්ඩන නියමය, වරදකරු කිරීම නැතහොත් අවසාන ආඥාව ප්‍රකාශ කරන ලද හෝ සටහන් කරන ලද දිනය ඇතුළත් කළ යුතු නමුත් සියලු ඉරිදා දිනයන් හා රජයේ නිවාඩු දිනයන් අත් හරිනු ලැබිය යුතු ය. කාලසීමාව ගණන් ගැනීම.

## VI වන කොටස

### සිවිල් නඩුවල මුද්දර සහ නඩු ගාස්තු

64. ප්‍රාථමික අධිකරණයක පවරනු ලබන සෑම සිවිල් නඩුවකදී ම, අවස්ථාවෝචිත පරිදි පැමිණිලිකරුගේ පැමිණිල්ලට ද, විත්තිකරු ගේ උත්තරයට ද, විත්තිකරුගේ හරස් ඉල්ලීම පිළිබඳව පැමිණිලි කරුගේ පිළිතුරට ද රුපියල් එකක වටිනාකම ඇති මුද්දරයක් ඇලවිය යුතු ය. සිවිල් නඩු සම්බන්ධයෙන් මුද්දර ගාස්තු.

65. සිවිල් නඩුවක් තීරණය කරනු ලැබූ විට සාධාරණ යයි අධිකර ණයට පෙනී යන ප්‍රමාණයක නඩු ගාස්තු පැමිණිලිකරුට හෝ විත්තිකරුට ප්‍රදානය කිරීමේ බලය සෑම ප්‍රාථමික අධිකරණයකට ම තිබිය යුතු ය. නඩු ගාස්තු.

## VII වන කොටස

### ඉඩම්වලට බලපාන්නා වූ ද සාමය කඩවීමේ තර්ජනයක් ඇත්තා වූ හෝ සාමය කඩවීමට ඉඩකඩ ඇත්තා වූ හෝ ආරාවුල් පිළිබඳ විභාග

ඉඩම්වලට බලපාන ආරාවුල් යොමු කිරීම.

66. (1) ඉඩම්වලට බලපාන ආරාවුලක් නිසා සාමය කඩ වීමේ තර්ජනයක් එල්ල වී ඇති හෝ සාමය කඩ වීමට ඉඩ ඇති හෝ කවර විටක වුව ද—

(අ) ඒ ආරාවුල පිළිබඳව පරීක්ෂණයක් පවත්වන පොලිස් නිලධරයා විසින්—

(i) ඒ ඉඩම පිහිටියේ යම් ප්‍රාථමික අධිකරණයක අධිකරණ බලසීමාව ඇතුළත ද ඒ ප්‍රාථමික අධිකරණය වෙත ඒ ආරාවුල සම්බන්ධයෙන් තොරතුරු වාර්තාවක් හැකි තාක් අප්‍රමාදව ඉදිරිපත් කළ යුතු අතර, ඒ තොරතුරු වාර්තාව ඉදිරිපත් කරනු ලැබූ දිනයට ඉක්බිතිව ම එළඹෙන්නා වූ ද අධිකරණය ඊළඟට රැස් වන්නා වූ ද දිනයෙහි ඒ ප්‍රාථමික අධිකරණය ඉදිරියෙහි පෙනී සිටින බවට වූ බැඳුම්කරයකට ඇතුළත් වන ලෙස ඒ ආරාවුලට සම්බන්ධ එක් එක් පාර්ශ්වකරුට නියම කළ යුතු ය; නැතහොත්

(ii) සාමය ආරක්ෂා කිරීමෙහි ලා අවශ්‍ය වන්නේ නම්, ආරාවුලට සම්බන්ධ පාර්ශ්වකරුවන් සිරභාරයට ගෙන, ඉඩම පිහිටා ඇත්තේ යම් ප්‍රාථමික අධිකරණයක අධිකරණ බලසීමාව තුළ ද ඒ ප්‍රාථමික අධිකරණය විසින් ඔවුන් සම්බන්ධයෙන් නීතිය අනුව ක්‍රියා කරනු ලැබීම පිණිස ඔවුන් නොපමාව ඒ අධිකරණය වෙත ඉදිරිපත් කළ යුතු අතර, ඔහු විසින්, ඒ අවස්ථාවේදීම ඒ ආරාවුල සම්බන්ධයෙන් තොරතුරු වාර්තාවක් අධිකරණය වෙත ඉදිරිපත් කළ යුතු ය; නැතහොත්

(ආ) ඒ ආරාවුලට සම්බන්ධ යම් පාර්ශ්වකරුවකු විසින්, ඒ පිළිබඳ සිද්ධි සහ තමන් ඉල්ලා සිටින සහනය දක්වමින් සහ වගඋත්තරකරුවන් වශයෙන්, ආරාවුලට සම්බන්ධ අනෙක් පාර්ශ්වකරුවන්ගේ නම් සහ ලිපිනයන් සඳහන් කරමින්, දිවුරුම් පත්‍රයක් මගින් තොරතුරු වාර්තාවක් ඒ ප්‍රාථමික අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකි ය. එවිට ඒ අධිකරණය විසින් ඒ අධිකරණයේ ක්‍රියා පිළිවෙල අනුව හෝ ලියාපදිංචි තැපෑලෙන් හෝ දැන්වීමක් යවමින්, ඒ දැන්වීමෙහි සඳහන් දිනයෙහි ඒ අධිකරණය ඉදිරියෙහි පෙනී සිටින ලෙස, යට කී පරිදි නම් කරනු ලැබූ පාර්ශ්වකරුවන්ට දැනුම් දිය යුතු ය. ඒ දිනය, තොරතුරු වාර්තාව ඉදිරිපත් කරනු ලැබූ දින සිට සති දෙකක් නොඉක්මවන දිනයක් විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ තොරතුරු වාර්තාවක් ප්‍රාථමික අධිකරණයක් වෙත ඉදිරිපත් කරනු ලබන අවස්ථාවක, ඒ තොරතුරු වාර්තාව ඉදිරිපත් කරනු ලැබුවේ යම් ආරාවුලක් සම්බන්ධයෙන් ද මේ කොටසෙහි විධිවිධාන සලසා ඇති ආකාරයට ඒ ආරාවුල විභාග කිරීමේ ද නිර්ණයක් හෝ ආඥාවක් කිරීමේ ද අධිකරණ බලය ප්‍රාථමික අධිකරණයට තිබිය යුතු අතර, ඒ අධිකරණ බලය ඒ අධිකරණය වෙත මෙයින් සතු කරනු ලැබේ.

(3) තම හිමිකම් පෑම් සඳහන් කළ දිවුරුම් පත්‍ර සමග ඒ හිමිකම් පෑම් සඳහා තමන් විශ්වාසය තබන ලේඛන (හෝ ඒවායේ සහතික පිටපත්) අමුණා ඉදිරිපත් කරන ලෙස පාර්ශ්වකරුවන්ට සහ සම්බන්ධතාවක් දක්වන යම් තැනැත්තන්ට විධාන කරමින්, එසේ ඒ දිවුරුම් පත්‍ර සහ ලේඛන (හෝ ඒවායේ සහතික පිටපත්) ඉදිරිපත් කිරීම සඳහා දිනයක්, (1) වන උපවගන්තිය යටතේ පාර්ශ්වකරුවන් ඉදිරිපත් කරනු ලැබූ දිනයේ දී හෝ ඒ උපවගන්තිය යටතේ අධිකරණය ඉදිරියෙහි පෙනී සිටීම සඳහා ඔවුන්ට නියම කර තිබූ දිනයේදී හෝ අධිකරණය විසින් නියම කළ යුතුය. ඒ දිනය එකී උපවගන්තිය යටතේ පාර්ශ්වකරුවන් ඉදිරිපත් කරනු ලැබූ දින සිට නැතහොත් අධිකරණයේ පෙනී සිටීම සඳහා ඒ උපවගන්තිය යටතේ ඔවුන්ට නියම කර තිබුණු දින සිට සති තුනක් නොඉක්මවන දිනයක් විය යුතු ය.

(4) ඉඩමට බලපාන ආරාවුලක් උද්ගත වී ඇති බව නිවේදනය කරන්නා වූ ද දැන්වීමෙහි සඳහන් දිනයෙහි දී අධිකරණය ඉදිරියේ පෙනී සිටින ලෙස සම්බන්ධතාවක් ඇති යම් තැනැත්තකුට නියම කරන්නා වූ ද දැන්වීමක්, ආරාවුලෙහි විෂය වස්තුව වූ ඉඩමේ හෝ ඉඩමේ කොටසෙහි හෝ යම් ප්‍රකට ස්ථානයක ඇලවීමට සැලැස්වීම, ඒ තොරතුරු වාර්තාව ඉදිරිපත් කරනු ලැබීමෙන් පසු එක් සතියක් ඉකුත්වීමට පෙර අධිකරණය විසින් කළ යුතු ය. තව ද, ඒ දැන්වීමෙහි සඳහන් කරනු ලබන දිනය අධිකරණයේ දී ඊළඟට ඒ නඩුව කැඳවනු ලබන දිනය විය යුතු ය:

එසේ වුව ද තොරතුරු වාර්තාව පොලිස් නිලධරයකු විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති අවස්ථාවක, සම්බන්ධතාවක් දක්වන තැනැත්තා විසින් අධිකරණය ඉදිරියෙහි පෙනී සිටීමට අතිරේකව තමන්ගේ හිමිකම් පෑම් දක්වන්නා වූ දිවුරුම් පත්‍ර සමග තමා විශ්වාසය තබන යම් ලේඛන (හෝ ඒවායේ සහතික පිටපත්) අමුණා ඉදිරිපත් කරනු ලැබිය යුතු යයි ද මේ උපවගන්තියේ ඉහතින් වූ විධිවිධානවල සඳහන් දැන්වීමෙන් නියම කරනු ලැබිය යුතු ය.

(5) දිවුරුම් පත්‍ර හා ලේඛන ඉදිරිපත් කිරීම සඳහා නියම කරනු ලැබූ දිනයෙහි දිවුරුම් පත්‍ර සහ ලේඛන කිසිවක් ඉදිරිපත් කර ඇති අවස්ථාවක, දිවුරුම් පත්‍ර ඉදිරිපත් කරන පාර්ශ්වකරුවන්ගේ ඉල්ලීම මත, යම් ලේඛන වේනොත්, ඒ ලේඛන සමග හරස් දිවුරුම්

පත්‍ර ඉදිරිපත් කිරීම සඳහා සති දෙකක් නොඉක්මවන කාලයක් අධිකරණය විසින් ඒ පාර්ශ්වකරුවන්ට දිය යුතු ය. හරස් දිවුරුම් පත්‍ර පිළියෙළ කිරීම සඳහා නඩු වාර්තාව රෙජිස්ට්‍රාර්වරයා ඉදිරිපිට දී කියවා බැලීමට ඒ පාර්ශ්වකරුවන්ට හෝ ඔවුන්ගේ නීතිඥවර වරයන්ට හෝ ප්‍රාථමික අධිකරණයේ විනිශ්චයකාරවරයා විසින් අව සර දිය යුතු ය.

(6) දිවුරුම් පත්‍ර සහ ලේඛන ඉදිරිපත් කිරීම සඳහා නියම කරනු ලැබූ දිනයෙහි දී හරස් දිවුරුම් පත්‍ර ඉදිරිපත් කිරීම සඳහා ඉල්ලීමක් කර නොමැති අවස්ථාවක හෝ හරස් දිවුරුම් පත්‍ර ඉදිරිපත් කිරීම සඳහා නියම කරනු ලැබූ දිනයෙහි එවැනි දිවුරුම් පත්‍ර සහ ලේඛන ඉදිරිපත් කර තිබුණේ වුව ද නොතිබුණේ වුව ද හෝ අධිකරණය විසින් නඩුව විභාගය සඳහා නියම කරනු ලැබීමට පෙර, ආරාවුල සම්බන්ධයෙන් සමථයට එළඹීමට පාර්ශ්වකරුවන් සහ සම්බන්ධතාවක් දක්වන තැනැත්තන් කිසිවකු වෙතොත් ඒ තැනැත්තන් පෙළඹවීමට සෑම ප්‍රයත්නයක්ම දැරිය යුතුය. තව ද පාර්ශ්වකරුවන් සහ සම්බන්ධ තාවක් දක්වන තැනැත්තන් සමථයට එළඹීමට එකඟවන්නේ නම්, ඒ සමථයට එළඹීම වාර්තාගත කොට පාර්ශ්වකරුවන් සහ සම්බන්ධතාවක් දක්වන තැනැත්තන් විසින් ඒ වාර්තාවට අත්සන් තැබිය යුතු අතර සමථයට එළඹීමේ නියමවලට අනුව ආඥා වක් අධිකරණය විසින් කරනු ලැබිය යුතු ය.

(7) පාර්ශ්වකරුවන් සහ සම්බන්ධතාවක් දක්වන තැනැත්තන් කිසිවකු වෙතොත් ඒ තැනැත්තන් සමථයට නොඑළඹෙන අවස් ථාවක, අධිකරණය විසින් නඩුව විභාග කිරීම සඳහා දිනයක් නියම කළ යුතු ය. ඒ දිනය අවස්ථාවෝචිත පරිදි දිවුරුම් පත්‍ර සහ ලේඛන නැතහොත් හරස් දිවුරුම් පත්‍ර සහ ලේඛන ඉදිරිපත් කිරීම සඳහා නඩුව කැඳවනු ලැබූ දිනයෙහි සිට සති දෙකක් නොඉක්මවන දිනයක් විය යුතු ය.

(8) (අ) පාර්ශ්වකරුවකුට හෝ සම්බන්ධතාව දක්වන තැනැත් තකුට හෝ මේ කොටස යටතේ පෙනී සිටීමක් සටහන් කිරීමට නියම කරනු ලැබූ අවස්ථාවක, ඔහු විසින් ඒ පෙනී සිටීම නීතිඥ වරයකු මඟින් සටහන් කරනු ලැබිය හැකි ය.

(ආ) පාර්ශ්වකරුවකු පෙනී සිටීම පැහැර හරින හෝ පෙනී සිට තම දිවුරුම් පත්‍රය සහ තම ලේඛන කිසිවක් වෙතොත් ඒ ලේඛන ඉදිරිපත් කිරීම පැහැර හරින හෝ අවස්ථාවක, ඔහු පැහැර හැරීම කළ තැනැත්තකු ලෙස සලකනු ලැබිය යුතු අතර, විභාගයට සහ භාගී වීමට ඔහුට හිමිකම නොතිබිය යුතු ය. නමුත් අධිකරණය විසින් ස්වකීය තීරණය සහ ආඥාව කිරීමේ දී ඒ පාර්ශ්වකරුගේ හිමිකම් පෑම සම්බන්ධයෙන් අධිකරණය ඉදිරියේ ඇති කරුණු සැලකිල්ලට ගත යුතු ය.

විභාගය ලඝු ආකාරයෙන් පැවැත්විය යුතු බව.

67. (1) මේ කොටස යටතේ වූ සෑම විභාගයක් ම ලඝු ආකාර යෙන් පවත්වනු ලැබිය යුතු අතර විභාගය ආරම්භ කර මාස තුනක් ඇතුළත එකී සෑම විභාගයක් ම අවසන් කළ යුතු ය.

(2) විභාගය අවසන් කරනු ලැබීමෙන් එක් සතියක් ඇතුළත ප්‍රාථමික අධිකරණයේ විනිශ්චයකාරවරයා විසින් ස්වකීය ආඥාව ප්‍රකාශ කළ යුතු ය.

(3) විභාගය අවසානයේ දී මේ කොටස යටතේ කිරීමට තමාට බලය ඇති යම් විධිවිධානයක් ඇතුලත් අතුරු ආඥාවක්, විභාගය අවසන් වීමට පෙර ප්‍රාථමික අධිකරණයේ විනිශ්චයකාරවරයා විසින් කිරීම නීත්‍යනුකූල විය යුතු ය.

68. (1) ආරාවුල යම් ඉඩමක හෝ එහි කොටසක හෝ සන්තකය සම්බන්ධයෙන් වූවක් වන අවස්ථාවක, 66 වන වගන්තිය යටතේ තොරතුරු වාර්තාව ඉදිරිපත් කරනු ලැබූ දිනයේ දී ඉඩමේ හෝ එහි කොටසේ සන්තකය දැරුවේ කවරකු ද යන්න තීරණය කිරීමත් ඒ ඉඩමෙහි හෝ එහි කොටසෙහි හෝ සන්තකයට හිමිකම් ලැබිය යුත්තේ කවරකු ද යන්න පිළිබඳව ආඥාවක් කිරීමත් විභාගය පවත්වන ප්‍රාථමික අධිකරණයේ විනිශ්චයකාරවරයාගේ කාර්යය විය යුතු ය.

*ආරාවුල සන්තකය සම්බන්ධයෙන් වූ විට ප්‍රාථමික අධිකරණයේ විනිශ්චයකාරවරයාගේ තීරණය සහ ආඥාව.*

(2) නිසි බලය ඇති අධිකරණයක ආඥාවක් හෝ තීන්දු ප්‍රකාශයක් යටතේ, (1) වන උපවගන්තිය යටතේ වූ ආඥාවක සඳහන් යම් තැනැත්තකු හෝ තැනැත්තන් වැඩි ගණනක් යම් ඉඩමකින් හෝ එහි යම් කොටසකින් හෝ නෙරපනු ලබන තුරු, ඒ තැනැත්තාට හෝ තැනැත්තන් වැඩි ගණනට ඒ ආඥාවේ දක්වා ඇති ආකාරයට ඒ ඉඩමෙහි හෝ එහි කොටසෙහි සන්තකයට හිමිකම තිබිය යුතු යයි ඒ ආඥාවෙන් ප්‍රකාශ කරනු ලැබිය යුතු අතර, ඒ නිසි බලය ඇති අධිකරණයේ ආඥාවක හෝ තීන්දු ප්‍රකාශයක බලය යටතේ හැර අන්‍යාකාරයකින් ඒ සන්තකය දැරීමෙහි ලා ඇති විය හැකි සියලු බාධා ඒ ආඥාවෙන් තහනම් කරනු ලැබිය යුතු ය.

(3) යම් ඉඩමක හෝ ඉඩමක යම් කොටසක හෝ සන්තකයට ඇති අයිතිවාසිකම සම්බන්ධයෙන් වූ ආරාවුලක් පිළිබඳව පවත්වනු ලබන විභාගයක දී, ඒ ඉඩමෙහි හෝ ඒ ඉඩම් කොටසෙහි හෝ සන්තකය දැරූ යම් තැනැත්තකුගේ එම සන්තකය, 66 වන වගන්තිය යටතේ තොරතුරු වාර්තාව ඉදිරිපත් කරනු ලැබූ දිනයට පූර්වයෙන් වූ මාස දෙකක කාලය තුළ දී බලහත්කාරයෙන් ඔහුට අහිමි කර ඇති බවට ප්‍රාථමික අධිකරණයේ විනිශ්චයකාරවරයා සෑහීමට පත් වූ අවස්ථාවක, ඒ බවට තීරණයක් කර එසේ සන්තකය අහිමි කරන ලද තැනැත්තාට ඒ සන්තකය ආපසු ලබාදිය යුතු බවට විධාන කෙරෙන්නා වූ ද, නිසි අධිකරණ බලය ඇති අධිකරණයක ආඥාවක හෝ තීන්දු ප්‍රකාශයක බලය යටතේ හැර අන්‍යාකාරයකින් ඒ සන්තකයට ඇති විය හැකි සියලු බාධා තහනම් කෙරෙන්නා වූ ද ආඥාවක් ඒ විනිශ්චයකාරවරයා විසින් කළ හැකි ය.

(4) (1) වන උපවගන්තිය යටතේ වූ ආඥාවක, (2) වන උපවගන්තියෙහි සඳහන් ප්‍රකාශයට හා තහනමට අමතරව, ආඥාවෙහි සඳහන් යම් පාර්ශ්වකරුවකුට ඒ ආඥාවේ සඳහන් ඉඩමේ හෝ එහි යම් කොටසක හෝ සන්තකය ආපසු ලබාදිය යුතු බවට විධානයක් ද ඇතුලත් විය හැකි ය.

ආරාවුල වෙනත් යම් අයිතිවාසිකමක් සම්බන්ධයෙන් වන විට, ප්‍රාථමික අධිකරණයේ විනිශ්චයකාර වරයාගේ තීරණය හා ආඥාව.

**69.** (1) ඒ ආරාවුල, යම් ඉඩමක හෝ ඉඩමක යම් කොටසක හෝ සන්තකයට ඇති අයිතිවාසිකම සම්බන්ධයෙන් වූවක් නොව, ඒ ඉඩමේ හෝ එහි කොටසක හෝ වෙන යම් අයිතිවාසිකමකට සම්බන්ධ වූවක් වන අවස්ථාවක දී, ආරාවුලෙහි විෂය කරුණු වූ අයිතිවාසිකමට හිමිකම ඇත්තේ කවරකුට ද යන්න ප්‍රාථමික අධිකරණයේ විනිශ්චයකාරවරයා විසින් තීරණය කර (2) වන උපවගන්තිය යටතේ ආඥාවක් කළ යුතු ය.

(2) මේ උපවගන්තිය යටතේ වූ ආඥාවක සඳහන් යම් තැනැත්තකුට ඒ ආඥාවේ දක්වා ඇති ඉඩමට හෝ ඉඩමේ යම් කොටසකට නැතහොත් ඉඩම හෝ ඉඩමේ යම් කොටසක් සම්බන්ධ යෙන් ඇත්තා වූ යම් අයිතිවාසිකමක්, නිසි අධිකරණ බලය ඇති අධිකරණයක ආඥාවක් හෝ තීන්දු ප්‍රකාශයක් හෝ ප්‍රකාර අහිමි කරනු ලබන තුරු, ඒ තැනැත්තාට ඒ අයිතිවාසිකමට හිමිකම තිබිය යුතු යයි ඒ ආඥාවෙන් ප්‍රකාශ කරනු ලැබිය හැකි අතර, ඉහත කී අන්දමේ ආඥාවක හෝ තීන්දු ප්‍රකාශයක හෝ බලය යටතේ හැර, අන්‍යාකාරයකින් ඒ පාර්ශ්වකරු විසින් ඒ අයිතිවාසිකම ක්‍රියාත්මක කිරීමෙහි ලා ඇති විය හැකි සියලු බාධා හෝ මැදිහත් වීම් ද තහනම් කළ හැකි ය.

සන්තකය සඳහා හෝ යම් අයිතිවාසිකමක් ක්‍රියාත්මක කිරීම සඳහා හෝ ඇප නියම කළ හැකි බව.

**70.** ඉඩමේ හෝ එහි කොටසක හෝ සන්තකයේ අයිතිවාසිකම ක්‍රියාත්මක කිරීම සඳහා හෝ ඒ ඉඩමෙහි යම් අයිතිවාසිකමක් ක්‍රියාත්මක කිරීම සඳහා ඇප තැබීම සම්බන්ධයෙන් හෝ ඒ ඉඩමේ යම් බෝගයක් නැතහොත් පලදාවක් විකිණීම සම්බන්ධයෙන් හෝ ඒ ඉඩමට ඇති යම් අයිතිවාසිකමක් ක්‍රියාත්මක කළ යුතු ආකාරය සම්බන්ධයෙන් හෝ යම් බෝගයක් නැතහොත් පලදාවක් විකිණී මෙන් ලැබෙන මුදල්වල භාරකාරත්වය හෝ ඒ මුදල් බෙදා හැර කිරීම සම්බන්ධයෙන් හෝ සුදුසු යයි ප්‍රාථමික අධිකරණයේ විනිශ්චයකාර වරයා කල්පනා කරන වෙනත් යම් විධාන ද මේ කොටස යටතේ කරනු ලබන ආඥාවක ඇතුළත් විය හැකි ය.

පාර්ශ්වකරු වන් පෙනී නොසිටින අවස්ථාවක කළ යුතු ආඥාව.

**71.** ආරාවුලෙහි පාර්ශ්වකරුවන් අධිකරණය ඉදිරියෙහි පෙනී නොසිටින අවස්ථාවක හෝ පෙනී සිටිය ද නැතහොත් ඉදිරිපත් කරනු ලැබුව ද ලේඛන අමුණා ඇතිව හෝ නැතිව හෝ වුවද දිවුරුම් පත්‍ර ඉදිරිපත් නොකරන අවස්ථාවක, අධිකරණය විසින්—

(අ) සන්තකය සම්බන්ධයෙන් වූ ආරාවුලක් පිළිබඳ නඩුවක දී නම්, එවකට සන්තකය දරන පාර්ශ්වකරුට සන්තකය තවදුරටත් තබා ගැනීමට අවසර දෙමින් ආඥාවක් කළ යුතු ය ; තව ද

(ආ) වෙනත් යම් අයිතිවාසිකමක් සම්බන්ධයෙන් වූ ආරාවුලක් පිළිබඳ නඩුවක දී නම්, ඒ අයිතිවාසිකම සම්බන්ධයෙන් එවකට පවත්නා තත්ත්වය තවදුරටත් පවත්වා ගෙන යාමට අවසර දෙමින් ආඥාවක් කළ යුතු ය.

72. මේ කොටස යටතේ තීරණයක් හෝ ආඥාවක් කළ යුතු වන්නේ—

(අ) ඉදිරිපත් කරනු ලැබූ තොරතුරු වාර්තාව සහ සපයනු ලැබූ දිවුරුම් පත්‍ර හා ලේඛන ද;

(ආ) යම් කාරණයක් සම්බන්ධයෙන් ඉදිරිපත් කිරීමට අධිකරණය විසින් අවසර දෙනු ලබන්නා වූ ද, ඉදිරිපත් කරන ලද දිවුරුම් පත්‍ර හෝ ලේඛන තුළින් උද්ගත වන්නා වූ ද ඒ කාරණය පිළිබඳ වෙනත් සාක්ෂි; සහ

(ඇ) ප්‍රාථමික අධිකරණයෙහි විනිශ්චයකාරවරයා විසින් ස්වකීය අභිමතය පරිදි අවසර දෙනු ලබන වාචික හෝ ලිඛිත කරුණු ඉදිරිපත් කිරීම් ද

පරීක්ෂා කිරීමෙන් හා සලකා බැලීමෙන් පසුව ය.

තීරණයක් කිරීම සඳහා ප්‍රාථමික අධිකරණයේ විනිශ්චයකාරවරයා විසින් ක්‍රියා කළ හැක්කේ කවර කරුණු මත ද යන වග.

73. මේ කොටස යටතේ කරන ලද ආඥාවක් කඩකරමින් ක්‍රියා කරන හෝ ඒ ආඥාව අනුව ක්‍රියා කිරීම පැහැර හරින හෝ යම් තැනැත්තකු වරදක් කරන අතර, ප්‍රාථමික අධිකරණයක විනිශ්චය කාරවරයකු විසින් ඔහු වරදකරු කරනු ලැබූ විට මාස හයක් නො ඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් එක් දහසක් නොඉක්මවන දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම හා දඩය යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

ආඥාවක් කඩ කිරීම හෝ ආඥාවක් අනුව ක්‍රියා කිරීම පැහැර හැරීම හෝ සම්බන්ධයෙන් දණ්ඩනය.

74. (1) යම් ඉඩමකට හෝ ඉඩමක යම් කොටසකට හෝ ඇති යම් අයිතිවාසිකමක් නැතහොත් සම්බන්ධතාවක් සිවිල් නඩුවක දී ඔප්පු කිරීමට යම් තැනැත්තකුට හැකි වේ ද ඒ අයිතිවාසිකමට හෝ සම්බන්ධතාවට බල පෑමක් නැතහොත් හානියක් මේ කොටස යටතේ වූ ආඥාවකින් සිදු නොවිය යුතු ය; තවද මේ වගන්තිවල බල පෑම ආරාවුලට සම්බන්ධ තැනැත්තන්ට පැහැදිලි කර දීම මේ කොටස යටතේ විභාගයක් ආරම්භ කරන ප්‍රාථමික අධිකරණයක විනිශ්චයකාරවරයකුගේ කාර්යය විය යුතු ය.

(2) මේ කොටස යටතේ කරන ලද යම් තීරණයකට හෝ ආඥාවකට විරුද්ධව අභියාචනයක් නොවිය යුතු ය.

සිවිල් නඩුවක දී ඔප්පු කරනු ලැබිය හැකි අයිතිවාසිකමකට හෝ සම්බන්ධතාවකට ආඥාව බල නොපෑ යුතු බව.

75. මේ කොටසෙහි "ඉඩම්වලට බලපාන ආරාවුල" යන්නට, යම් ඉඩමක හෝ ඉඩමක කොටසක හෝ සන්තකයට ඇති අයිතිවාසිකම පිළිබඳව වූ සහ එහි පිහිටි ගොඩනැගිලිවල සන්තකය පිළිබඳව වූ හෝ, ඒ ඉඩමේ නැතහොත් ඉඩම් කොටසේ මායිම් පිළිබඳව වූ හෝ, යම් ඉඩමක් හෝ ඉඩමක කොටසක් හෝ වගා කිරීමේ අයිතිවාසිකම පිළිබඳව වූ හෝ, යම් ඉඩමක නැතහොත් ඉඩමක යම් කොටසක බෝගවලට හෝ පලදාවට ඇති අයිතිවාසිකම පිළිබඳව වූ හෝ, ඉඩමට බලපාන පරවිශතාවක ස්වභාවයේ යම් අයිතිවාසිකමක් පිළිබඳව වූ හෝ යම් ආරාවුලක් ඇතුළත් වන අතර මේ කොටසෙහි "ඉඩම" පිළිබඳ යම් සඳහන් කිරීමකට ඒ ඉඩම මත පිහිටි යම් ගොඩනැගිල්ලක් පිළිබඳ සඳහන් කිරීමක් ද ඇතුළත් වේ.

"ඉඩම්වලට බලපාන ආරාවුල" යන්නෙහි අර්ථය.

පිස්කල් විසින් අධිකරණයේ ආඥා ක්‍රියාවේ යොදවනු ලැබිය යුතු බව.

76. මේ කොටසේ විධිවිධාන යටතේ කරනු ලබන සියලු ආඥා, අවශ්‍ය වූ විට, අධිකරණයේ පිස්කල් විසින් ක්‍රියාවේ යොදවනු ලැබිය යුතු ය.

විනිශ්චයට භාජනව පවත්නා නඩු කටයුතු.

77. මේ පනත ක්‍රියාත්මක කරනු ලබන දිනයට ඉහතින් වූ දින යෙහි, ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 44 දරන යුක්තිය පසිඳලීමේ පනතේ 62 වන වගන්තිය යටතේ මහේස්ත්‍රාත් අධිකරණයක විනිශ්චයට භාජනව පැවැති සියලු නඩු කටයුතු උචිත ප්‍රාථමික අධි කරණයට භාර වන්නේ ය. තව ද ඒ සියලු නඩු කටයුතු සංජානනය කිරීමට ද විභාග කිරීමට ද ඒ නඩු කටයුතු පිළිබඳව තීරණයක් හෝ ආඥාවක් කිරීමට ද නැතහොත් ඒ නඩු කටයුතු දිගටම පවත්වා ගෙන ගොස් අවසන් කිරීමට ද ඒ ප්‍රාථමික අධිකරණයට අධිකරණ බලය තිබිය යුතු අතර, ඒ අධිකරණ බලය මෙයින් එම අධිකරණය සතු කරනු ලැබේ. තවද මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් මේ පනත ක්‍රියාත්මක කරනු ලබන දිනයට පෙර කරන ලද යම් තීරණ යක් සහ ආඥාවක් ඒවා උචිත ප්‍රාථමික අධිකරණය විසින් කරන ලද්දක් මෙන් ම වලංගු හා බලාත්මක විය යුතු ය:

එසේ වුව ද මේ පනත ක්‍රියාත්මක කරනු ලබන දිනයට ඉහතින් ම වූ දිනයෙහි සාක්ෂි මෙහෙයවීම ආරම්භ කර තිබුණේ යම් නඩු කටයුත්තක ද ඒ නඩු කටයුත්ත හැකිතාක් දුරට මේ කොටසෙහි විධිවිධාන සලසා ඇති ආකාරයට එකී මහේස්ත්‍රාත් අධිකරණය විසින් විභාග කොට තීරණය කරනු ලැබිය යුතු ය.

## VIII වන කොටස

### අත්හැරුණු කරුණු

අත්හැරුණු කරුණු.

78. මේ පනතෙහි විධිවිධාන සලස්වා නොමැති යම් කාරණයක් පැන නැගුනහොත්, නඩුව හෝ නඩු කටයුත්ත අපරාධ නඩුවක් වන අවස්ථාවක සාදෘශ කාරණයක් කෙරෙහි බලපාන 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ විධිවිධාන සහ නඩුව සිවිල් නඩුවක් හෝ නඩු කටයුත්තක් වන අවස්ථාවක සාදෘශ කාරණයක් කෙරෙහි බලපාන සිවිල් නඩු විධාන සංග්‍රහයේ විධිවිධාන නඩුවේ යුක්ති ධර්මය සඳහා අවශ්‍ය වන සුදුසු අනුවර්තන සහිතව පිළිගෙන අදාළ කළ යුතු ය.